
කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
கமத்தொழில் மற்றும் பெருந்தோட்டக் கைத்தொழில் அமைச்சு
Ministry of Agriculture and Plantation Industries

# 2023

## උතුරට කප්රුක

### උතුරු පොල් ත්‍රිකෝණය



## පොල් වගාකිරීමේ මණ්ඩලය
தென்னைப் பயிர்ச்செய்கைச் சபை
Coconut Cultivation Board

# වාර්ෂික වාර්තාව
வருடாந்த அறிக்கை
**Annual Report**

www.coconutsrilanka.lk
coconut App

## දැක්ම

ශ්‍රී ලංකාව ලෝකයේ වඩාත්ම කාර්යක්ෂම හා ඵලදායී පොල් නිෂ්පාදකයා කරවීම.

## இலக்கு

இலங்கையினை உலகத்தில் மிகவும் வினைத்திறனான மற்றும் உற்பத்தி திறனான தென்னை உற்பத்தியாளராக்குதல.

## Vision

To make Sri Lanka globally the most efficient & effective Coconut Producer.

## මෙහෙවර

ශ්‍රී ලංකාවේ දේශීය පරිභෝජන ඉල්ලුම සහ අපනයන අවශ්‍යතාවය සපුරාලමින්, ස්වයංපෝෂිත තත්ත්වය ළඟකර ගැනීම පිණිස ඵලදායී උපදේශන හා ව්‍යාප්ති සේවාවක් මගින් පොල් නිෂ්පාදනය ඉහළ නැංවීමත්, පොල් ඉඩම්වල ඵලදායීතාව ඉහළ නැංවීමත් තුළින් පොල් වගාකරුවාට ඉහළ ජීවන මට්ටමක් සාක්ෂාත් කරවීම අපගේ මෙහෙවරයි.

## செயற்பணி

இலங்கையில் உள்நாட்டு நுகர்வுத் தேவை மற்றும் ஏற்றுமதித் தேவையினை பூர்த்தி செய்தல், சுயபோசணை நிலைமையினை நெருங்கும் பொருட்டு வினைத்திறனான மற்றும் உற்பத்தி திறனாக ஆலோசனையாளர் மற்றும் பரவலாக்கல் சேவையின் ஊடாக தென்னை உற்பத்தியினை உயர்த்துதலும், தென்னங் காணிகளில் உற்பத்தித் திறனினை உயர்த்துவதன் ஊடாக தென்னைப் பயிர்ச்செய்கையாளர்களுக்கு உயர்ந்த வாழ்க்கை மட்டத்தினை வழங்குவதும் எங்களது செயற்பணியாகும்.

## Mission

To achieve a high living standard to the coconut producer through increasing the coconut production by means of an effective advisory & extension service and development assistant to increase the productivity of coconut land while meeting the domestic consumer demand and export requirement.

# වාර්ෂික වාර්තාව

## 2023

## අරමුණු

- සාම්ප්‍රදායික පොල් වගාව සිදුකරන ප්‍රදේශවලින් බැහැරව උතුරු පළාත කේන්ද්‍රකර ගනිමින් පොල් වගාව ව්‍යාප්ත කිරීම.
- සාම්ප්‍රදායික ව්‍යාප්ති සේවාව වෙනුවට පොල් ක්ෂේත්‍රයට අදාළ සියලුම පාර්ශවකරුවන් එක්රැස්කර ගනිමින් බහුවිධ ප්‍රවේශ ව්‍යාප්ති ක්‍රමවේදය හරහා ව්‍යාප්ති සේවාව ශක්තිමත් කිරීම.
- ව්‍යාප්ති සේවාව ඩිජිටල්කරණය කිරීම තුළින් වඩාත් ඵලදායී ව්‍යාප්ති සේවාවක් වගාකරුවන්ට ලබාදීම.
- පොල් ඉඩම්වලට කාබනික හා රසායනික පොහොර යෙදීමෙන් පෝෂක ඌනතා අවම කර ගනිමින් හොඳ අස්වැන්නක් ලබා ගැනීමට පොල් වගාකරුවන්ට මග පෙන්වීම.
- පාංශු තෙතමන සංරක්ෂණ ක්‍රම සහ පොල් ඉඩම්වල ජලසම්පාදන පද්ධති භාවිතය මගින් පොල් අස්වැන්න ඉහළ නැංවීම.
- පොල් වගාවට සහ අස්වැන්නට හානි කරන රෝග සහ පළිබෝධවල බලපෑම් අවම කිරීම සහ ඒ තුළින් අස්වැන්න වැඩි කිරීම.
- පොල් ඉඩම් සඳහා සුදුසු අතුරු භෝග සහ සත්ව පාලන ක්‍රම හඳුන්වා දීමෙන් පොල් ඉඩම්වල ඵලදායිතාව ඉහළ නැංවීම.
- පොල් වගාවේ ඵලදායිතාව කාර්යක්ෂම ලෙස ඉහළ නැංවීම සඳහා වගාකරුවන්ට ශෂ්‍ය විද්‍යාත්මක පිළිවෙත් පිළිබඳ දැනුම ලබා දීම.
- කප්රුක පුරවර සාමාජිකයින්ගේ ජීවනෝපාය නගාසිටුවීමට සහ ව්‍යාපාර අවස්ථා නිර්මාණය කිරීමට උපකාර වන වැඩසටහන් අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම.
- යාන්ත්‍රිකකරණය මගින් පොල් අස්වැන්න උපරිම කිරීම.

## ඉලක්ක

- සෑම පොල් වගාකරුවකු වෙතට පොල් වගාවේ තාක්ෂණික දැනුම ගෙන යාම හා කුසලතා වර්ධනය කිරීම.
- ඉල්ලුම පදනම්කරගත් ව්‍යාප්ති සේවාවන් පවත්වාගෙන යාම සහ උසස් තත්ත්වයේ යෙදවුම් ලබා දීම.
- ශ්‍රී ලංකාව තුළ තිරසාර පොල් වගාවක් ස්ථාපනය කිරීම.
- පොල් ඉඩම සඳහා සුදුසු අතුරුබෝග වගාකිරීමෙන් පොල් ඉඩම්වල උපයෝගීතාවය ඉහළ දැමීම .
- ගෘහස්ථ පරිභෝජනයට, පොල් ආශ්‍රිත නිෂ්පාදනයන්ට හා විදේශීය වෙළඳපලට අවශ්‍ය වන පොල් ප්‍රමාණය රට තුළ නිෂ්පාදනය කිරීම.

# හැඳින්වීම

පොල් වගාකිරීමේ මණ්ඩලය, **1971** අංක **46** දරන පොල් සංවර්ධන පනතේ අංක **02** වගන්තිය යටතේ දිවයිනේ පොල් සංවර්ධනය අරමුණු කොට වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා විසින් **1972** මාර්තු මස **30** වෙනි දින ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝගයකින් පිහිටුවනු ලැබීය.

**2023** ජනවාරි මස **01** දින සිට **2023** දෙසැම්බර් **31** වෙනි දින දක්වා කාලය තුළ පොල් වගාකිරීමේ මණ්ඩලයේ ක්‍රියාකාරිත්වය මෙම වාර්තාවට ඇතුලත්කොට ඇත.

එකී පනත ප්‍රකාරව මණ්ඩලයේ කාර්යභාර්ය පහත දැක්වෙන අයුරු අර්ථ දක්වා ඇත.

☞ පොල් වගාකළ ඉඩම්වල ඵලදාව වර්ධනය කිරීම හා ඵලදාව වර්ධනය කිරීමෙහිලා සහාය වීම.

☞ ඉඩම්වල පොල් වගාකිරීම, ඒවා වගාකිරීම වැඩිදියුණු කිරීම හා විධිමත් කිරීමට සහාය වීම. (තෘණ ඇතුළුව) වෙනත් වගාවන්ගේ අතුරු වගාව සඳහා සුදුසු පොල් වගාකළ ඉඩම් තෝරා ගැනීම හා එකී ඉඩම්වල අතුරු වගා වැඩපිළිවෙල වැඩි දියුණු කිරීම, මෙහෙයවීම, පවත්වාගෙන යාමට සහාය වීම.

☞ පොල් වගාකළ ඉඩම්වල සත්ත්ව පාලනය වැඩි දියුණු කිරීම හා විධිමත් කිරීම, ඊට සහාය වීම හා එහි නියුක්ත වීම.

☞ පොල් වගාකළ ඉඩම්වල පොල් හා වෙනත් බෝග වැවීම සම්බන්ධයෙන් නිසි වගා ක්‍රම විස්තර කිරීම, ජනප්‍රිය කිරීම, වැඩිදියුණු කිරීම හා මෙහෙයවීම.

☞ පොල් කර්මාන්තයට සහාය වීම, උපදේශක හා ව්‍යාප්ති සේවකයින් පුහුණු කිරීම.



# අධ්‍යක්ෂ මණ්ඩලය 2023

| | | |
|---|---|---|
| 01 ඒ.වී.කේ.මාධවී හේරත් මහත්මිය | — | සභාපති |
| 02 කේ.එස්.විජයකීර්ති මහතා | — | අතිරේක ලේකම් - කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය |
| 03 ටී.එම්.ජේ.බණ්ඩාර මහතා | — | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් - (වැ.බ.) මුදල් අමාත්‍යාංශය |
| 04 ආචාර්ය සනාතනී රණසිංහ මහත්මිය | — | අධ්‍යක්ෂ - පොල් පර්යේෂණ ආයතනය |
| 05 සුරේෂ් සිල්වා මහතා | — | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |
| 06 ඒ.ඊ.ප්‍රනාන්දුපුල්ලේ මහතා | — | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |
| 07 එස්.කේ.මලවිආරච්චි මහතා | — | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |
| 08 එම්.කේ.රංගන සුජීව මහතා | — | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |
| 09 දුලාන් හෙට්ටිආරච්චි මහතා | — | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |
| 10 කාවින්ද දුල්ලාව මහතා | — | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |
| 11 මල්රාජ් පීරිස් මහතා | — | අධ්‍යක්ෂ මණ්ඩල නිරීක්ෂක |
| 12 ආචාර්ය රොෂාන් පෙරේරා මහතා | — | අධ්‍යක්ෂ මණ්ඩල නිරීක්ෂක |



# සභාපතිතුමියගේ පණිවිඩය

අඩසියවසක් පුරාවට දේශීය ආර්ථිකය ශක්තිමත් කිරීම උදෙසා අපනයනය පදනම් කරගත් වැවිලි බෝග කාණ්ඩය යටතේ වර්ගීකරණයකර ඇති ප්‍රධාන බෝගයක් ලෙස පොල් වගාව සැලකිය හැකිය. මෙවැනි පසුබිමක් තුළ පොල් ක්ෂේත්‍රයේ උන්නතිය උදෙසා දශක පහකට ආසන්න කාලයක් පුරාවට සුවිශාල කාර්යභාර්යක් සිදුකරන රාජ්‍ය ආයතනයක් ලෙස පොල් වගාකිරීමේ මණ්ඩලය හඳුන්වා දිය හැකිය. පෙර වර්ෂයන්හීදී රටක් ලෙස මුහුණ දුන් සියලු බාධක ජයගනිමින් නොසැලී ඉදිරියට යමින් **2023** වර්ෂයේදී ද රාජ්‍ය ආයතනයක් ලෙස පොල් ක්ෂේත්‍රයේ අභිවෘධිය උදෙසා තම දායකත්වය උපරිමෙන් ලබාදීමට හැකිවිය. ඒ අනුව **2023** වර්ෂයේදී පොල් ගෙඩි මිලියන **2,944**ක වාර්ෂික පොල් අස්වැන්නක් ලබා ගනිමින් පොල් ආශ්‍රිත නිෂ්පාදන අපනයනය තුළින් දේශිය ආර්ථිකයට ඇ. ඩොලර් මිලියන **700**ක අපනයන ආදායමක් උපයාදීමට තම දායකත්වය ලබාදුන් වගකිව යුතු රාජ්‍ය ආයතනයක් ලෙස පොල් වගාකිරීමේ මණ්ඩලය විසින් ලබාදෙන ලද දායකත්වය අගය කළ යුතු වේ.

**2023** වර්ෂයේදී පොල් වගාකිරීමේ මණ්ඩලය සඳහා ජාතික අයවැයෙන් ප්‍රාග්ධන වැය ශීර්ෂය යටතේ රු. මිලියන **500**ක් මහා භාණ්ඩාගාරය මගින් ප්‍රතිපාදන වෙන්විය. **2023** වර්ෂයේදී පොල් වගාකරුවෙක් වෙතම ගුණාත්මයෙන් ඉහළ පොල් පැළයක් ලබාදීම අරමුණු කරගනිමින් පොල් පැළ මිලියන **3.14**ක් ලබාදුන් අතර පොල් පැළ මිලියන **2.715**ක් විවිධ සහනාධාර වැඩසටහන හරහා ක්ෂේත්‍රයේ සිටුවීමට පොල් වගාකිරීමේ මණ්ඩලය සමත් විය. මෙම වර්ෂයේදී සාම්ප්‍රදායික ප්‍රදේශවලින් බැහැරව උතුරු පළාත තුළ පොල් වගාව ප්‍රචලිත කිරීමේ අරමුණින් උතුරු පළාත් පොල් ත්‍රිකෝණය පිහිටුවීමේ විශේෂ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරන ලදී. උතුරු පළාතේ පේදුරු තුඩුව, සිලාවතුර හා කෝකිලායි යන ප්‍රදේශ යා කරමින් ඉදිරි වසර තුනක් ඇතුළත් පොල් අක්කර **50,000**ක් සංවර්ධනය කිරීම මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ විය. මෙම ව්‍යාපෘතිය යටතේ **2023** වර්ෂයේදී පොල් පැළ **466,926**ක් ලබාදෙන ලදී.

එමෙන්ම නාගරික ප්‍රදේශ කේන්ද්‍ර කරගනිමින්, කුරුණෑගල දිස්ත්‍රික්කයේ නැවත සහ යටි වගාව ප්‍රවර්ධනය කිරීම, දකුණ කුඩා පොල් ත්‍රිකෝණයේ පොල් ඉඩම් සංවර්ධනය කිරීම සහ උතුරු පළාතට ආවේණික ඉහළ පොල් අස්වැන්නක් ලබාදෙන පොල් පැළ නිෂ්පාදනය ඉලක්ක කරගනිමින් බීජ පොල් ලබාගැනීමේ විශේෂ ව්‍යාපෘති **04**ක් ක්‍රියාවට නංවන ලදී.

තවද පොල් වගාවේ අස්වැන්නේ තීරණාත්මක සාධකයක් වන රෝග හා පළිබෝධ හානි අතරින් **2022** වර්ෂයේදී ශ්‍රී ලංකාව පුරා සීඝ්‍රයෙන් පැතිරී ගිය සුදු මැස්සා මර්දන විශේෂ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරන ලදී. මෙම සුදු මැස්සා හානි මර්දන කාර්යය සඳහා රු. මිලියන **85.5**ක් මූල්‍ය ප්‍රතිපාදන ලෙස හිමි වූ අතර හානියට ලක් වූ පොල් ගස් **949,612**ක් සඳහා ප්‍රතිකාර කරන ලද අතර දැනුවත් කිරීමේ වැඩසටහන් **2,919**ක් පවත්වන ලදී. මෙම වර්ෂය තුළදී හානියට ලක් වූ පොල් ගස් සඳහා ප්‍රතිකාර කිරීමට වගාකරුවන්ට අවශ්‍ය කොහොඹ තෙල් ලීටර **20,000**ක් සහ දියර ඉසින යන්ත්‍ර **700**ක් නොමිලේ ලබාදෙන ලදී.

එමෙන්ම **2023** වර්ෂයේ මුල් කාර්තුවේ දකුණු පළාත තුළ බ්‍රොන්ටිස්පා කෘමි උවදුර නැමැති නව කෘමි උවදුරක් වාර්තා විය. මෙම කෘමි උවදුර මර්දනය සඳහා රු. මිලියන **9.7** ක ප්‍රතිපාදන වෙනුවෙන් රෝගී ගස් **17,927**ක් එන්නත් කිරීම සිදුකරන ලදී.

මීට අමතරව පොල් වගාකිරීමේ මණ්ඩලයේ ව්‍යාප්ති සේවයට නැවුම් අත්දැකීමක් එකතු කරමින් පොල් වගාකරුවන් වෙත ප්‍රවේශ වීමේ වෙනස්ම වූ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කරන ලදී. පොල් ක්ෂේත්‍රයේ සියලුම පාර්ශවකරුවන් එකම වේදිකාවකට රැස්කර ගනිමින් සෑම ප්‍රාදේශීය කාර්යාලයක්ම ආවරණය වන පරිදි බහුවිධ ප්‍රවේශය නම් වු නව්‍යකරණ ව්‍යාප්ති ක්‍රමවේදයක් වෙත ප්‍රවිෂ්ට වීමට හැකි විය.

පොල් වගාකිරීමේ මණ්ඩලයේ තවාන් හා පොල් උයන් සංවර්ධන අංශය මගින් තම දෛනික නිෂ්පාදනයන්ට අමතරව අගය එකතු කළ නිෂ්පාදනයන් සඳහා දිරිගන්වමින් වැඩි ඵලදායීතාවයක් ලබා ගැනීම වෙනුවෙන් මෙහෙයවීමට හැකිවිය. ඒ අනුව තවාන් සංවර්ධන අංශය රු. මිලියන **219.514**ක අතිරික්තයක්ද උපයා ඇත.

මෙම වර්ෂයේදී පොල් වගාකිරීමේ මණ්ඩලයේ අරමුණු හා ඉලක්ක වෙත ළඟාවීම සඳහා අපගේ සියලු කාර්ය මණ්ඩලය කැප වූ බව සතුටින් ප්‍රකාශ කරන අතර ඔවුන් සියලු දෙනාටම මාගේ ගෞරවනීය ස්තූතිය පුදකරමි. එලෙසම පොල් වගා ක්ෂේත්‍රයේ උන්නතිය උදෙසා සිදුකරන ලද කාර්යයන් සාර්ථක කර ගැනීමට ගරු වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා සහ ගරු රාජ්‍ය අමාත්‍යතුමා, අමාත්‍යාංශ ලේකම්තුමා ඇතුලු අමාත්‍යාංශීය කාර්ය මණ්ඩලය විසින් ලබාදෙන ලද නිවැරදි මඟ පෙන්වීම, මාර්ගෝපදේශකත්වය වෙනුවෙන් මාගේ හදපිරි ස්තූතිය පුද කරමි.

ඒ.වී.කේ.මාධවී හේරත්
සභාපති
පොල් වගාකිරීමේ මණ්ඩලය

# සාමාන්‍යාධිකාරීතුමාගේ පණිවිඩය



ආර්ථිකමය සහ සංස්කෘතිමය වශයෙන් ශ්‍රී ලංකික ජනතාවට අතිශයින් වැදගත් වන්නා වූ, වැවිලි බෝග කාණ්ඩය යටතේ වර්ගීකරණයකර ඇති ප්‍රධාන බෝගයක් ලෙස පොල් සැලකිය හැක. එබැවින් පොල් වගාව ප්‍රවර්ධනය සඳහා ස්ථාපිත රාජ්‍ය ආයතන ත්‍රිත්වය අතරින් පොල් වගාකිරීමේ මණ්ඩලය ජනතාවට ඉතා වැදගත් වූත්, සමීපවූත්, ආයතනයකි. ගෘහස්ථ පරිභෝජනය සහ අපනයන අවශ්‍යතාවය සම්පූර්ණ කිරීම සඳහා වාර්ෂිකව නිෂ්පාදනය කරනු ලබන පොල් ගෙඩි ප්‍රමාණය ඉහළ නැංවීම අරමුණුකර ගනිමින්, සාම්ප්‍රදායික හා සාම්ප්‍රදායික නොවන ඉඩම්වල පොල් වගාව ප්‍රචලිත කිරීමත්, පවතින පොල් වගාවේ පොල් ඵලදාව ඉහළ නැංවීමටත් ප්‍රමුඛතාවය ලබාදෙමින් 2023 වර්ෂයේ සංවර්ධන වැඩසටහන් රාශියක් ක්‍රියාත්මක කරන ලදී.

පොල් වගාකිරීමේ මණ්ඩලය විසින් 2023 වර්ෂයේදී ක්‍රමවත් පොල් වගාව යටතේ, ගෙවතු වගා සහ පවතින වගාවේ පාළු පැළ සිටුවීම යන සහනාධාර යටතේ පොල් පැළ මිලියන 2.715ක් ක්ෂේත්‍රයේ සිටුවීමට හැකිවිය. එමගින් දිවයිනේ පොල් වගාබිම් ප්‍රමාණයට තවත් පොල් වගාබිම් අක්කර 42,435කට ආසන්න ප්‍රමාණයක් එකතු කිරීමට හැකියාව ලැබුණි. එසේම උතුරු පළාත කේන්ද්‍රකර ගනිමින් උතුරු පළාතේ පොල් වගාව ප්‍රචලිත කිරීමේ අරමුණින් ඉදිරි වසර තුනක කාලයකදී පොල් අක්කර 50,000ක් සංවර්ධනය කිරීමේ උතුරු පළාත් පොල් ත්‍රිකෝණය පිහිටුවීමේ විශේෂ ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට හැකිවිය. එමෙන්ම පවතින පොල් ඉඩම්වල පූර්ණ ගොවිපල සංවර්ධනය මගින් වාණිජ කෘෂිකර්මය පොල් ඉඩම් ආශ්‍රිතව ප්‍රවර්ධනය කිරීම අරමුණුකර ගනිමින් කප්රුක ආයෝජන ණය වැඩසටහන යටතේ වගාකරුවන් 586ක් වෙත ඉඩම් අක්කර 3,003ක් සංවර්ධනය සඳහා රු. මිලියන 430.49ක් ලබා දී ඇත.

ආයතනයේ පුරප්පාඩුව පැවති තනතුරු රාශියක් සඳහා සේවක උසස්වීම් සහ නව බඳවාගැනීම් සිදුකරන ලදී. එමෙන්ම, පොල් වගාකිරීමේ මණ්ඩලයේ සේවයේ නියුතු නිලධාරීන් සඳහා කාර්යක්ෂමතා කඩයිම් පරීක්ෂණ පැවැත්වීම, සමස්ත කාර්ය මණ්ඩලය සඳහා බාහිර හා අභ්‍යන්තර පුහුණු වැඩසටහන් මගින් දැනුම, ආකල්ප, කුසලතා වර්ධනයටත් අවශ්‍ය කටයුතු සම්පාදනය කරන ලදී.

මෙවැනි සුවිශේෂී වැඩසටහන් රාශියක් 2023 වර්ෂය තුළ පොල් වගාකිරීමේ මණ්ඩලය විසින් ක්‍රියාත්මක කිරීමේදී එම කටයුතු සාර්ථක කරගැනීම සඳහා අපගේ සියලු කාර්ය මණ්ඩලය කැප වූ බව සතුටින් ප්‍රකාශ කරන අතර, ඔවුන් සියලු දෙනාටම මාගේ ගෞරවනීය ස්තූතිය පුදකරමි.

එලෙස සෑම අවස්ථාවකදීම අපව දිරි ගන්වමින්, නිවැරදිව මෙහෙයවමින් සහ අවශ්‍ය ශක්තිය ලබාදුන් ගරු වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා සහ රාජ්‍ය අමාත්‍යතුමා, අමාත්‍යාංශ ලේකම්තුමා ඇතුලු අමාත්‍යාංශීය කාර්ය මණ්ඩලයට ද විශේෂයෙන්ම පොල් වගාකිරීමේ මණ්ඩලයේ සභාපතිතුමිය ඇතුලු අධ්‍යක්ෂ මණ්ඩලයට ද මාගේ හදපිරි ස්තූතිය පුදකරමි.

ඩබ්.එම්.ඒ.බී.විජේසිංහ
සාමාන්‍යාධිකාරී
පොල් වගාකිරීමේ මණ්ඩලය

# පොල් වගාකිරීමේ මණ්ඩලය ගැන සැකෙවින්


දිවයිනේ පොල් වගාව සංවර්ධනය කිරීම සඳහා මණ්ඩලයේ දැක්ම හා මෙහෙවර වඩාත් විධිමත්ව හා ඵලදායිතාවයෙන් යුක්තව සාක්ෂාත්කර ගැනීම සඳහා ප්‍රධාන කාර්යාලය, ප්‍රාදේශීය කාර්යාල **20**ක්, පොල් සංවර්ධන නිලධාරි කාර්යාල **265**ක්, පොල් සංවර්ධන පුහුණු මධ්‍යස්ථාන **03**ක්, තවාන් **36**ක්, ආදර්ශ පොල් උයන් **11**ක් හා බීජ නිෂ්පාදන ඒකකයකින් පොල් වගාකිරීමේ මණ්ඩලය සමන්විත වේ.

## ප්‍රධාන කාර්යාලය


"කප්රුක පියස"
9/428, පොල් වගාකිරීමේ මණ්ඩලය,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.
දුරකථන- 011-2861331, 0115635623
ෆැක්ස්- 011-5549507
විද්‍යුත් තැපෑල - ccb@sltnet.lk
වෙබ් අඩවිය - www.coconut.gov.lk

| | |
|---|---|
| සාමාන්‍යාධිකාරී | 01 |
| නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී | 04 |
| සහකාර සාමාන්‍යාධිකාරී | 08 |
| ප්‍රාදේශීය කළමනාකරුවන් හා විෂය භාර කළමනාකරුවන් | 36 |
| කණිෂ්ඨ කළමනාකරුවන් | 95 |
| භාෂා පරිවර්ථකයින් | 02 |
| කළමනාකරණ සහකාර (තාක්ෂණික) | |
| පොල් සංවර්ධන නිලධාරීන් | 300 |
| නේවාසික තවාන් භාර නිලධාරී | 40 |
| තාක්ෂණික සහකාර | 03 |
| පුහුණු නිලධාරී | 01 |
| කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) | |
| පොල් සංවර්ධන සහකාර | 76 |
| කළමනාකරණ සහකාර | 200 |
| ප්‍රාථමික ශ්‍රේණියේ සේවකයින් | 152 |
| සමස්ත කාර්ය මණ්ඩල ශක්තිය 918 කි | |

# පොල් වගාකිරීමේ මණ්ඩලයේ ආයතනික ව්‍යුහය



# පොල් වගාකිරීමේ මණ්ඩලයේ ව්‍යාප්ති හා සේවා ජාලය



# පොල් වගාකිරීමේ මණ්ඩලයේ ව්‍යාප්ති හා සේවා ජාලය

| ප්‍රාදේශීය කාර්යාල 20ක් | | | |
|---|---|---|---|
| අනු අං. | ප්‍රාදේශීය කාර්යාල | ලිපිනය | දුරකථන අංකය |
| 01 | අනුරාධපුර ප්‍රාදේශීය කාර්යාල | තුන්වන පියවර, දහයියාගම හන්දිය, අනුරාධපුර. | 025-2222543 |
| 02 | අම්පාර ප්‍රාදේශීය කාර්යාල | ධර්මපාල මාවත, කච්චේරිය ඉදිරිපිට, අම්පාර | 063-2222477 |
| 03 | කළුතර ප්‍රාදේශීය කාර්යාල | නාගොඩ, කළුතර | 034-2222732 |
| 04 | කෑගල්ල ප්‍රාදේශීය කාර්යාල | වරකාඋල්ල වලව්ව, කරඩුපන, නුවර පාර, කෑගල්ල | 035-2222120 |
| 05 | කුරුණෑගල ප්‍රාදේශීය කාර්යාල | වැහැර, කුරුණෑගල | 037-2222534 |
| 06 | කුලියාපිටිය ප්‍රාදේශීය කාර්යාල | අංක 20, පන්නල පාර, කුලියාපිටිය | 037-2281169 |
| 07 | ගම්පහ ප්‍රාදේශීය කාර්යාල | බැන්ඩියමුල්ල, ගම්පහ | 033-2222037 |
| 08 | ගාල්ල ප්‍රාදේශීය කාර්යාල | ලබුදූව, අක්මීමන, ගාල්ල | 091-2234501 |
| 09 | ත්‍රිකුණාමලය ප්‍රාදේශීය කාර්යාල | කුඹුරුප්පිඩි, ත්‍රිකුණාමලය | 026-2054018 |
| 10 | පොළොන්නරුව ප්‍රාදේශීය කාර්යාල | නව නගරය, පොළොන්නරුව | 027-2222377 |
| 11 | මඩකලපුව ප්‍රාදේශීය කාර්යාල | මයිලම්බවැලි, තන්නමුනෙයි, මඩකලපුව | 065-2240103 |
| 12 | මාතර ප්‍රාදේශීය කාර්යාල | අංක 331/9, අනගාරික ධර්මපාල මාවත, නූපේ, මාතර. | 041-2222060 |
| 13 | මාතලේ ප්‍රාදේශීය කාර්යාල | නුවර පාර, කොහොඹිලිවල, මාතලේ | 066-2222047 |
| 14 | මාරවිල ප්‍රාදේශීය කාර්යාල | මුදුකටුව, මාරවිල | 032-2254237 |
| 15 | මොණරාගල ප්‍රාදේශීය කාර්යාල | හුලංදාව දකුණ, මොණරාගල | 055-2276058 |
| 16 | යාපනය ප්‍රාදේශීය කාර්යාල | අංක 595/10, නාවලර් පාර, නල්ලූර්, යාපනය | 021-2284501 |
| 17 | රත්නපුර ප්‍රාදේශීය කාර්යාල | නව නගරය, රත්නපුර | 045-2228561 |
| 18 | හම්බන්තොට ප්‍රාදේශීය කාර්යාල | අංක 27, තංගල්ල පාර, හම්බන්තොට | 047-2220144 |
| 19 | වව්නියාව ප්‍රාදේශීය කාර්යාල | අංක 25, පත්තිනියාර්, මහිලන්කුලම්, තාන්ඩිකුලම්, වව්නියාව | 024-2050344 |
| 20 | මහනුවර ප්‍රාදේශීය කාර්යාල | අංක 74/2 බෝධියංගන මාවත, බෝවල, මහනුවර | 081-2222447 |

# පොල් වගාකිරීමේ මණ්ඩලයේ ව්‍යාප්ති හා සේවා ජාලය

| පොල් වගාකිරීමේ මණ්ඩලය සතු බීජ පොල් පැළ තවාන් 36ක් | | | |
|---|---|---|---|
| අනු අං. | ප්‍රාදේශීය කාර්යාලය | ලිපිනය | දුරකථන අංකය |
| 01 | අනුරාධපුර | 1. කලාවැව පොල් පැළ තවාන, කලාවැව විජිතපුර. | 025-2264194 |
| 02 | අම්පාර | 2. උහන පොල් පැළ තවාන, පාලම්කඳවුර, උහන. | 063-2250119 |
| 03 | කළුතර | 3. කොරොස්දූව පොල් පැළ තවාන, කොරොස්දූව, වාද්දූව | 038-2295126 |
| 04 | කෑගල්ල | 4. මත්තමගොඩ පොල් පැළ තවාන, මත්තමගොඩ, කන්නත්තොට. | 035-2289105 |
| | | 5. එරමිණිගොල්ල පොල් පැළ තවාන, එරමිණිගොල්ල , හිරිවඩුන්න. | 035-2263006 |
| | | 6. පොල්ගහවෙල පොල් පැළ තවාන, සෙරපිස්වත්ත, පනලිය, පොල්ගහවෙල. | 037-2244367 |
| 05 | කුරුණෑගල | 7. ඉබ්බාගමුව පොල් පැළ තවාන, ඉබ්බාගමුව. | 037-2235776 |
| | | 8. වාරියපොල පොල් පැළ තවාන, වාරියපොල. | 037-2267691 |
| | | 9. නිකවැරටිය පොල් පැළ තවාන, නිකවැරටිය. | 037-2260619 |
| | | 10. වෙන්නොරුව පොල් පැළ තවාන, මුතුගල වත්ත, වෙන්නොරුව. | 037-2249836 |
| 06 | කුලියාපිටිය | 11. බිංගිරිය පොල් පැළ තවාන, ප්‍රසන්නගම, බිංගිරිය. | 032-2246425 |
| | | 12. හෙට්ටිපොල පොල් පැළ තවාන, හෙට්ටිපොල. | 037-2291332 |
| | | 13. දියදොර පොල් පැළ තවාන, පහල දියදොර. | 037-2282537 |
| 07 | ගම්පහ | 14. වල්පිට පොල් පැළ තවාන, වල්පිට. | 033-2272559 |
| | | 15. කිරිදිවැල පොල් පැළ තවාන, කිරිදිවැල. | 033-2267704 |
| 08 | ගාල්ල | 16. බද්දේගම පොල් පැළ තවාන, පෙඩරුස්වත්ත, හල්පාතොට, බද්දේගම, ගාල්ල. | 091-2292745 |
| | | 17. ලබුදූව පොල් පැළ තවාන, අක්මීමන, ගාල්ල. | 091-2234501 |
| 09 | ත්‍රිකුණාමලය | 18. කුඹුරුපිඩ්ඩි පොල් පැළ තවාන, කුඹුරුපිඩ්ඩි, ත්‍රිකුණාමලය. | 026-2054018 |
| 10 | පොලොන්නරුව | 19. පරාක්‍රම සමුද්‍රය පොල් පැළ තවාන, රිවඩ් අළුවිහාරේ උද්‍යානය, පරාක්‍රම සමුද්‍රය. | 027-2224304 |
| | | 20. උල්හිටිය පොල් පැළ තවාන, උල්හිටිය වත්ත, ගිරාඳුරුකෝට්ටේ. | 027-2222377 |
| 11 | මඩකලපුව | 21. මයිලම්බවේලි පොල් පැළ තවාන, මයිලම්බවේලි, තන්නමුනෙයි, මඩකලපුව. | 065-2240924 |
| 12 | මාතලේ | 22. දොඩන්ගස්ලන්ද පොල් පැළ තවාන, බලවත්තල වත්ත, දොඩන්ගස්ලන්ද. | 037-2252625 |
| 13 | මාරවිල | 23. කිරිමැටියාන පොල් පැළ තවාන, කිරිමැටියාන, ලුණුවිල. | 032-2254237 |
| | | 24. විල්පොත පොල් පැළ තවාන, විල්පොත, බත්තුළුඔය. | 032-2254237 |
| | | 25. අට්ටවිල්ලුව පොල් පැළ තවාන, අට්ටවිල්ලුව, කුරුණෑගල පාර, පුත්තලම. | 032-2254237 |
| 14 | මොණරාගල | 26. හඳපානාගල පොල් පැළ තවාන, හඳපානාගල වෙහෙරයාය. | 055-2274665 |
| | | 27. වැලිපිටිය පොල් පැළ තවාන, වැලිපිටියවත්ත, නන්පුරාව, බිබිල. | 055-2276058 |
| 15 | වව්නියා | 28. මඩු පොල් පැළ තවාන, මන්නාරම. | 024-2050344 |
| 16 | යාපනය | 29. කිලිනොච්චි පොල් පැළ තවාන, ඩී 3, පන්නන්කන්නි, කිලිනොච්චි. | 021-2284501 |
| | | 30. දේවිපුරම් පොල් පැළ තවාන, අංක 29/A කොටස, දේවිපුරම්, පුදුකුඩිරිප්පු, මුලතිව්. | 021-2284501 |

# පොල් වගාකිරීමේ මණ්ඩලයේ ව්‍යාප්ති හා සේවා ජාලය

| | | | |
|---|---|---|---|
| | | 31. අච්චුවේලි පොල් පැළ තවාන, වාසවිලාන් පාර, අච්චුවේලි, යාපනය. | 021-2284501 |
| | | 32. අලම්පිල් පොල් පැළ තවාන, අලම්පිල්, මුලතිව්. | 021-2284501 |
| 17 | රත්නපුර | 33. ඇඹිලිපිටිය පොල් පැළ තවාන, තුංකම, ඇඹිලිපිටිය. | 047-2230569 |
| 18 | හම්බන්තොට | 34. මැදමුලන පොල් පැළ තවාන, මැදමුලන, වීරකැටිය. | 047-2246359 |
| | | 35. මයුරපුර පොල් පැළ තවාන, මයුරපුර, හම්බන්තොට. | 047-2220144 |
| 19 | මහනුවර | 36. පල්ලේකැලේ පොල් පැළ තවාන, පල්ලේකැලේ, බලගොල්ල, කෙන්ගල්ල. | 081-2063595 |

| ආදර්ශ බීජ පොල් උයන් 11ක් | | |
|---|---|---|
| අනු අං. | ලිපිනය | දුරකථන අංකය |
| 01 | මහයාය ආදර්ශ පොල් උයන, මාකඳුර, ගෝනවිල. | 031-2299781 |
| 02 | ලේනව ආදර්ශ පොල් උයන, හිරියාල, ලේනව. | 037-4944425 |
| 03 | ඩේසිවැලි ආදර්ශ පොල් උයන, ඉලුක්වෙල, වැඋඩ. | 037-2299880 |
| 04 | රත්දෙණිය ආදර්ශ පොල් උයන, වාරියපොල. | 037-5555217 |
| 05 | නාගන්සෝල ආදර්ශ පොල් උයන, වන්නි, රස්නායකපුර. | 037-4944464 |
| 06 | බෝපිටිය ආදර්ශ පොල් උයන, බෝපිටිය (වයඹ). | 037-2288601 |
| 07 | ගර්වලන්ඩ් ආදර්ශ පොල් උයන, නාඹිරිත්තන්කඩවර, වැලිපැන්නගහමුල. | 037-4930928 |
| 08 | කොහොඹාන ආදර්ශ පොල් උයන, කොහොඹාන වත්ත, ගොනාගොල්ල. | 063-3632186 |
| 09 | කොරෙයි ආදර්ශ පොල් උයන, තිරුක්කෝවිල්. | 067-3694530 |
| 10 | පාසිකුඩා ආදර්ශ පොල් උයන, කල්කුඩා, පාසිකුඩා. | 065-2050224 |
| 11 | පලෙයි ආදර්ශ පොල් උයන, නුවර පාර, පලෙයි. | 021-2050013 |

| පොල් වගාකිරීමේ මණ්ඩලය සතු පුහුණු මධ්‍යස්ථාන 03ක් | | | |
|---|---|---|---|
| අනු අං | පුහුණු මධ්‍යස්ථානය | ලිපිනය | දුරකථන අංකය |
| 01 | ලුණුවිල පොල් සංවර්ධන පුහුණු මධ්‍යස්ථානය | සහකාර සාමාන්‍යාධිකාරි (පුහුණු) පොල් සංවර්ධන පුහුණු මධ්‍යස්ථානය, පොල් වගාකිරීමේ මණ්ඩලය, බණ්ඩිරිප්පු වත්ත, ලුණුවිල. | 031-2255048 |
| 02 | මැදමුලන දක්ෂිණ ලංකා පොල් සංවර්ධන පුහුණු මධ්‍යස්ථානය | ස්ථාන භාර නිලධාරි, දක්ෂිණ ලංකා පොල් සංවර්ධන පුහුණු මධ්‍යස්ථානය, මැදමුලන, වීරකැටිය. | 047-2257534 |
| 03 | යාපනය පොල් සංවර්ධන පුහුණු මධ්‍යස්ථානය | ස්ථානභාර නිලධාරි, පොල් පැළ තවාන, අරලි පාර, අච්චුවේලි, යාපනය | 021-3141245 |

| බීජ නිෂ්පාදන ඒකකය | | | |
|---|---|---|---|
| 01 | බීජ නිෂ්පාදන ඒකකය | අංක 19, තම්මිට පාර, මීගමුව | 031-2226119 |

# පොල් වගාකිරීමේ මණ්ඩලයේ ව්‍යාප්ති හා සේවා ජාලය

| පොල් තාක්ෂණික උද්‍යානය | | | |
|---|---|---|---|
| 01 | පොල් සංස්කෘතික උද්‍යානය | පොල් තාක්ෂණික උද්‍යානය<br>පාසිකුඩා ආදර්ශ පොල් උයන,<br>කල්කුඩා | 065-2050224 |

| පොල් වගාකිරීමේ මණ්ඩලය සතු සංචාරක නිවාස 09ක් | | | |
|---|---|---|---|
| අනු අංකය | සංචාරක නිවාසය | ලිපිනය | දුරකථන අංකය |
| 01 | කතරගම | “කොකෝවිලා සංචාරක නිවාසය”,<br>සංචාරක නිවාස පෙදෙස,<br>ඩිපෝ පාර,<br>කතරගම. | 0472236344 |
| 02 | පාසිකුඩා | පාසිකුඩා ආදර්ශ පොල් උයන,<br>පොල් වගාකිරීමේ මණ්ඩලය,<br>පාසිකුඩා ,<br>කල්කුඩා. | 0652050224 |
| 03 | පලෙයි | පලෙයි ආදර්ශ පොල් උයන,<br>පොල් වගාකිරීමේ මණ්ඩලය,<br>A9 පාර,<br>පලෙයි. | 0212050013 |
| 04 | පොළොන්නරුව | “පුලතිසි කොකෝවිලා සංචාරක නිවාසය”,<br>පොල් වගාකිරීමේ මණ්ඩලය,<br>කලහගල පාර,<br>නව නගරය,<br>පොළොන්නරුව. | 0272052881 |
| 05 | නිලාවේලි | “කොකෝවිලා සංචාරක නිවාසය”,<br>නිලාවේලි,<br>කුඹුරුප්පිඩ්ඩි,<br>ත්‍රිකුණාමලය. | 0262054019 |
| 06 | කොහොඹාන | කොහොඹාන ආදර්ශ පොල් උයන,<br>පොල් වගාකිරීමේ මණ්ඩලය,<br>ගොනාගොල්ල,<br>අම්පාර. | 063222477 |
| 07 | හඳපානාගල | “හඳපානාගල සංචාරක නිවාසය”,<br>හඳපානාගල පොල් පැළ තවාන, හඳපානාගල,<br>වෙහෙරයාය. | 0552274665 |
| 08 | කටුකැලියාව | “කොකෝවිලා සංචාරක නිවාසය”,<br>මහිලා මාවත,<br>කටුකැලියාව,<br>ගල්කඩවල. | 0252222543 |
| 09 | පොලොන්නරුව | “බෝපිටිය සංචාරක නිල නිවාසය”,<br>බෝපිටිය ආදර්ශ පොල් උයන,<br>කු/බෝපිටිය(වයඹ). | 0372288601 |

# පොල් වගාකිරීමේ මණ්ඩලයේ ව්‍යාප්ති හා සේවා ජාලය

| “කප්තුරුපාය” වෙළෙඳසැල් හා සේවා මධ්‍යස්ථාන 05ක් | | |
|---|---|---|
| අනු අං. | ලිපිනය | දුරකථන අංකය |
| 01 | මහයාය ආදර්ශ පොල් උයන, මාකඳුර, ගෝනවිල. | 031-2299781 |
| 02 | බෝපිටිය ආදර්ශ පොල් උයන, බෝපිටිය (වයඹ). | 037-2288601 |
| 03 | පොල් වගාකිරීමේ මණ්ඩලය, “කප්රුක පියස”, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල. | 011-2861331 |
| 04 | ඩේසිවැලි ආදර්ශ පොල් උයන, ඉලුක්වේල, වැඋඩ. | 037-2299880 |
| 05 | අම්පාර ප්‍රාදේශීය කර්යාලය, ධර්මපාල මාවත, කච්චේරිය ඉදිරිපිට, අම්පාර. | 063-2222477 |

# ඇතුලත පිටු


01. ව්‍යාප්ති හා සංවර්ධන අංශය 001

02. ආදර්ශ පොල් උයන් හා තවාන් සංවර්ධන අංශය 017

03. පරිපාලන හා මානව සම්පත් කළමනාකරණ අංශය 033

04. අභ්‍යන්තර විගණන අංශය 037

05. මූල්‍ය කළමනාකරණ අංශය 040

06. විගණකාධිපතිගේ වාර්තාව 046


දෙමළ භාෂා පරිවර්තනය

ඉංග්‍රීසි භාෂා පරිවර්තනය

# 1.0 ව්‍යාප්ති හා සංවර්ධන අංශය

## 1.1 පොල් වගාකිරීමේ මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරන ලද සංවර්ධන වැඩසටහන්

### 1.1.1 ක්‍රමවත් පොල් වගාව යටතේ පැළ සිටුවීම

නව වගාවන්, නැවත වගාවන් හෝ යටි වගාවන් සිදුකිරීම සඳහා සහනදායී මිලකට පොල් පැළ ලබා දීම මෙම සහනාධාරය යටතේ සිදුකරයි. මෙහි දී අවම අක්කර ¼ සිට උපරිම අක්කර 15 දක්වා වගා කිරීමට පොල් පැළ ලබාදෙයි. එසේම මෙම පැළ වගාකරු වෙත ප්‍රවාහනය කර දෙනු ලබන අතර පැළ නිකුත් කිරීමට පෙර පැළ සිටුවීම හා නඩත්තුව පිළිබඳ තාක්ෂණික උපදෙස් පොල් වගාකිරීමේ මණ්ඩලය මගින් ලබා දේ. 2023 වර්ෂයේදී මෙම වැඩසටහන මගින් පොල් පැළ 348,000ක් සිටුවීමට ඉලක්ක කරන ලද අතර වර්ෂය අවසන් වන විට පැළ 386,247ක් සිටුවීමට පොල් වගාකිරීමේ මණ්ඩලය සමත් විය. මීට අමතරව තැඹිලි වගා ප්‍රවර්ධන වැඩසටහන යටතේ තැඹිලි පැළ 11,021ක් බෙදා දී ඇත.

### 1.1.2. ගෙවතු වගා වැඩසටහන

ශ්‍රී ලාංකිකයින්ගේ දෛනික පොල් පරිභෝජන අවශ්‍යතාවය තම ගෙවත්තෙන්ම නිෂ්පාදනය කිරීමට ගෙවතු හිමියන් යොමු කිරීම ප්‍රධාන අරමුණ කර ගනිමින් මෙම වැඩසටහන ක්‍රියාත්මක කරයි. මෙම සහනාධාර වැඩසටහන ක්‍රමවේද කිහිපයක් මගින් ගෙවතු හිමියන්ට පොල් පැළ ලබා දීම සිදු කරනු ලැබේ. මේ යටතේ පොල් පැළ 1,759,541ක් සහනාධාර ලෙස වගාකරුවන් වෙත ලබා දී ඇත. මෙම පැළ ප්‍රමාණය පහත ක්‍රමවේද යටතේ සිටුවීම සිදු කරන ලදී.

1. ගෙවතු වගා වැඩසටහන
2. ශ්‍රී සම්පත කප්රුක නැවුම් ගෙදොරට වගා වැඩසටහන
3. විශේෂ ගෙවතු වගා වැඩසටහන
4. අමාත්‍ය මණ්ඩල අනුමැතිය යටතේ ගෙවතු පොල් පැළ ලබා දීමේ වැඩසටහන

### 1.1.3. පාළු පැළ සිටුවීම මගින් පොල් ඉඩමක පැවතිය යුතු ප්‍රශස්ථ පොල් ගස් සංඛ්‍යාව නඩත්තු කිරීම

අක්කරයක නඩත්තු කළයුතු ප්‍රශස්ථ පොල් ගස් ගණන නොපැවතීම ශ්‍රී ලංකාවේ පොල් වගා ඉඩම්වල පොල් ඵලදායීතාව අඩුවීමට ප්‍රධාන හේතුවක් ලෙස හඳුනාගෙන ඇත. 2023 වසරේදී පොල් ඉඩම් පුනරුත්ථාපනය යටතේ පාළු සිටුවීම සඳහා ඉලක්කගත පැළ ප්‍රමාණය 60,000ක් විය. 2023 වර්ෂය අවසන් වන විට මෙම වැඩසටහන යටතේ පොල් පැළ 92,113ක් සිටුවන ලදී.

ඉහත නව/නැවත/යටි වගා වැඩසටහන, ගෙවතු වගා වැඩසටහන, පාළු පැළ සිටුවීමේ වැඩසටහන යටතේ ලබා දුන් සියලුම පැළ රු.175/= ක වටිනාකමක් සහිත බිම් පැළයක් රු.75/= ට සහ රු.300/= ක වටිනාකමක් සහිත බදුන් පැළයක් රු.200/= ට ලෙස සහනදායී මිලකට වගාකරුවෙකුහට ලබා දී ඇත. ඒ අනුව බිම් පොල් පැළයක හා බදුන් පොල් පැළයක සහනාධාර වටිනාකම රු.100/= ක් විය. මේ අනුව 2023 වර්ෂයේ දී වගාකරුවන් වෙත ලබා දුන් මුළු පොල් පැළ සංඛ්‍යාව පැළ 3,139,661ක් වූ අතර මින් පොල් පැළ 423,813ක් මුදලට අලෙවි කරන ලද අතර පොල් පැළ 2,715,848ක් සහනාධාර යටතේ වගාකරුවන්ට ලබා දී ඇත.

වගු අංක 1.1. 2023 වර්ෂයේදී ප්‍රාදේශීය කාර්යාල මට්ටමින් ප්‍රගතිය

| ප්‍රාදේශීය කාර්යාලය | ක්‍රමවත් පොල් වගාව යටතේ පැළ සිටුවීමේ භෞතික ප්‍රගතිය (පැළ) | ගෙවතු වගා වැඩසටහන - ප්‍රගතිය (පැළ) | පාළු පැළ සිටුවීමේ ප්‍රගතිය(පැළ) |
|---|---|---|---|
| මොණරාගල | 20,506 | 151,721 | 1,151 |
| මාතර | 3,339 | 24,142 | 539 |
| කුරුණෑගල | 58,791 | 215,172 | 13,576 |
| කුලියාපිටිය | 50,293 | 124,367 | 31,392 |
| කෑගල්ල | 9,331 | 89,054 | 2,102 |
| ගම්පහ | 25,579 | 111,278 | 8,457 |
| කළුතර | 7,673 | 68,157 | 2,644 |
| මාරවිල | 45,445 | 121,709 | 15,800 |
| රත්නපුර | 11,886 | 86,492 | 1,965 |
| හම්බන්තොට | 36,189 | 94,408 | 3,121 |
| අනුරාධපුරය | 28,729 | 102,370 | 3,401 |
| ත්‍රිකුණාමලය | 9,709 | 51,467 | 805 |
| පොළොන්නරුව | 9,112 | 38,996 | 826 |
| අම්පාර | 17,065 | 89,380 | 1,178 |
| මාතලේ | 12,165 | 69,789 | 1,026 |
| ගාල්ල | 8,639 | 69,571 | 1,318 |
| මඩකලපුව | 9,048 | 93,464 | 906 |
| යාපනය | 15,166 | 58,857 | 1,174 |
| වව්නියාව | 1,932 | 27,239 | 238 |
| මහනුවර | 5,650 | 71,908 | 494 |
| **එකතුව** | **386,247** | **1,759,541** | **92,113** |

ඒ අනුව 2023 වර්ෂයේ ජූලි මාසය වන විට ඇස්තමේන්තුගත පොල් වපසරිය හෙක්ටයාර 480,215ක් වේ. දිස්ත්‍රික්ක අනුව ඇස්තමේන්තුගත පොල් වගා වපසරිය පහත වගුවේ දක්වා ඇත.

වගු අංක 1.2. 2023 වර්ෂයේදී දිස්ත්‍රික්ක අනුව ඇස්තමේන්තුගත පොල් වගා වපසරිය

| දිස්ත්‍රික්කය | අක්කර ගණන | හෙක්ටයාර්* |
|---|---|---|
| කොළඹ | 20,925 | 8,472 |
| ගම්පහ | 113,909 | 46,117 |
| කළුතර | 31,722 | 12,843 |
| මහනුවර | 23,650 | 9,575 |
| මාතලේ | 32,360 | 13,101 |
| නුවරඑළිය | 3,964 | 1,605 |
| ගාල්ල | 35,227 | 14,262 |
| මාතර | 37,310 | 15,105 |
| හම්බන්තොට | 65,470 | 26,506 |
| යාපනය | 18,088 | 7,323 |
| කිලිනොච්චිය | 5,379 | 2,178 |
| මන්නාරම | 7,599 | 3,077 |
| වව්නියාව | 10,008 | 4,052 |
| මුලතිව් | 11,917 | 4,825 |
| මඩකලපුව | 14,364 | 5,815 |
| අම්පාර | 20,210 | 8,182 |
| ත්‍රිකුණාමලය | 10,811 | 4,377 |
| කුරුණෑගල | 362,251 | 146,660 |
| පුත්තලම | 136,533 | 55,277 |
| අනුරාධපුර | 56,361 | 22,818 |
| පොළොන්නරුව | 25,243 | 10,220 |
| බදුල්ල | 11,211 | 4,539 |
| මොණරාගල | 41,419 | 16,769 |
| රත්නපුර | 52,127 | 21,104 |
| කෑගල්ල | 20,925 | 8,472 |
| **ශ්‍රී ලංකාව** | **1,168,983** | **473,274** |

***ඇස්තමේන්තු ගත**

### <u>1.1.4 2023 වර්ෂයේ විශේෂ ව්‍යාපෘති</u>

2023 වර්ෂයේ දී විශේෂ ව්‍යාපෘති 05ක් සඳහා රු.මි. 45.9 ප්‍රතිපාදන පොල් ක්ෂේත්‍රයට ආයෝජනය කරන ලදී.

01. ප්‍රදේශයට ආවේනික ඉහළ පොල් අස්වැන්නක් ලබා දෙන පොල් පැළ නිෂ්පාදනයට අවශ්‍ය බීජ පොල් මිලදී ගැනීමේ ව්‍යාපෘතිය .

මෙම ව්‍යාපෘතිය උතුරු පළාත ඉලක්ක කරගනිමින් ක්‍රියාත්මක කරන ලදී. මේ සඳහා රු.මි. 9.8ක ප්‍රතිපාදන වැය කරන ලද අතර බීජ පොල්වලින් ලබා ගන්නා පොල් පැළ 83,000ක ප්‍රමාණය ඉදිරියේ දී උතුරු පළාතේ වගාකරුවන්ට ලබා දෙයි.

02. නාගරික ගෙවතුවල දෙමුහුම් පොල් පැළ සිටුවීම සඳහා පොල් පර්යේෂණ ආයතනයෙන් පොල් පැළ මිලදී ගැනීමේ ව්‍යාපෘතිය.

මෙම ව්‍යාපෘතිය නාගරික ප්‍රදේශ කේන්ද්‍ර කරගනිමින් දිවයින පුරා ක්‍රියාත්මක වේ. මේ සඳහා රු.මි. 9.8ක ප්‍රතිපාදන වෙන්කර ඇත. මේ යටතේ මිලදීගනු ලබන CRIC 65 දෙමුහුම් පොල් පැළ 24,500ක් නාගරික ගෙවතුවල සිටුවනු ලැබේ.

03. කුරුණෑගල දිස්ත්‍රික්කයේ නැවත හා යටි වගා සඳහා අවශ්‍ය පොල් පැළ නිෂ්පාදනයට අවශ්‍ය බීජ පොල් මිලදී ගැනීමේ ව්‍යාපෘතිය.

මෙම ව්‍යාපෘතිය සඳහා රු.මි. 8.8ක් වැය කරන ලද අතර ඒ යටතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ නැවත හා යටි පොල් වගාව ප්‍රවර්ධනයට වගාකරුවන්ට පොල් පැළයකට රු. 200.00ක සහනාධාරයක් ලබා දෙනු ලැබේ. මෙම ව්‍යාපෘතිය මගින් බීජ පොල් 80,000ක් මිලදී ගෙන ඇත.

04. දකුණු කුඩා පොල් ත්‍රිකෝණයේ පොල් ඉඩම් සංවර්ධනය කිරීම සඳහා පැළ නිෂ්පාදනයට අවශ්‍ය බීජ පොල් මිලදී ගැනීමේ ව්‍යාපෘතිය.

මෙම ව්‍යාපෘතිය සඳහා රු.මි. 8.00ක් වැය කරන ලද අතර ඒ යටතේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ පොල් පැළ සිටුවීම සඳහා අවශ්‍ය බීජ පොල් 89,090ක් මිලදී ගෙන ඇත. මෙම බීජ පොල්වලින් ලැබෙන පොල් පැළ 2024 වර්ෂයේ දී පොල් පැළයකට රු. 200.00ක සහනාධාරයක් යටතේ වගාකරුවන්ට අලෙවි කරනු ලැබේ.

05. උතුරු පළාත් පොල් ත්‍රිකෝණය පිහිටුවීමේ ව්‍යාපෘතිය.

උතුරු පළාතේ පේදුරුතුඩුව, සිලාවතුර හා කෝකිලායි යන ප්‍රදේශ යාකරමින් පොල් අක්කර 50,000ක් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය 2023 සිට 2025 යන වර්ෂ තුළ දී ක්‍රියාත්මක කරයි. එහි මූලික අදියර ලෙස 2023 වර්ෂයේදී උතුරු පළාත සඳහා පොල් පැළ 466,926ක් ලබාදී ඇත. මෙම ව්‍යාපෘතිය සඳහා 2023 වර්ෂයේ දී අමාත්‍යාංශ ප්‍රතිපාදන වශයෙන් රු.මි. 9.5ක් ලබාදී ඇති අතර පොල් පැළ නිෂ්පාදනය සහ ප්‍රවාහනය සඳහා වැය වූ ඉතිරි මුදල් පොල් වගාකිරීමේ මණ්ඩලය විසින් වැය කර ඇත.

වගු අංක1.3. 2023 වර්ෂයේදී උතුරු පොල් ත්‍රිකෝණ ව්‍යාපෘතිය යටතේ පොල් පැළ ලබාදීමේ ප්‍රගතිය

| දිස්ත්‍රික්කය | බෙදා දුන් පොල් පැළ සංඛ්‍යාව |
|---|---|
| **යාපනය** | 62,488 |
| **කිලිනොච්චිය** | 38,395 |
| **මුලතිව්** | 139,141 |
| **වව්නියාව** | 153,117 |
| **මන්නාරම** | 73,785 |
| **එකතුව** | 466,926 |

## 1.1.5.වැලිගම කොළ මැලවීමේ හා කුණුවීමේ රෝග මර්දන වැඩසටහන

ශ්‍රී ලංකාවේ දකුණු ප්‍රදේශයේ මාතර දිස්ත්‍රික්කයට අයත් වැලිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයෙන් මුලින්ම වාර්තා වූ වැලිගම කොළ මැලවීමේ හා කුණුවීමේ රෝගී තත්ත්වය පසු කාලීනව ගාල්ල හා හම්බන්තොට දිස්ත්‍රික්කවලින්ද වාර්තා විය. වෛරසයකට බොහෝදුරට සමාන ෆයිටොප්ලාස්මා ව්‍යාධිකාරකය මගින් මෙම රෝගය ඇති කෙරෙන අතර දැනට ලෝකයේ කිසිඳු රටක ෆයිටොප්ලාස්මා සඳහා නිසි ප්‍රතිකාරයක් සොයාගෙන නොමැත.

මෙම රෝගය හඳුනා ගැනීමෙන් පසුව පොල් පර්යේෂණ ආයතනය, ශාක ආරක්ෂක පනත ක්‍රියාත්මක කිරීමේ නෛතික බලධරයා වන කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්වරයා සමඟ එක්ව මාතර, හම්බන්තොට හා ගාල්ල දිස්ත්‍රික්කයේ ග්‍රාම සේවා කොට්ඨාශ 157ක් රෝග කලාප වශයෙන් නම් කර ඇත.

එසේම රෝගය පිටතට බෝවීම වැළැක්වීම සඳහා ගාල්ල දෙනියාය සිට හක්මන හරහා තංගල්ල දක්වා වන මාර්ගයක කි.මී. 86 ක් දිග කි.මී. 3 පළල රෝග වැලක්වීමේ කලාපයක් නම් කරන ලදී. මෙම කලාපයේ සියලුම රෝගී ගස් ගලවා දමන අතර, මෙම කලාපයේ මායිම් වලින් පිටට පොල් ගසෙහි කිසිඳු ජීව ද්‍රව්‍යයක් ගෙනයාම ශාක ආරක්ෂක පනත යටතේ තහනම් කරන ලදී. එසේම කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් මෙම කුලයට අයත් අනෙකුත් බෝගයන් ප්‍රවාහනය සඳහා ද මෙම තහනම පනවා ඇත.

මෙම රෝගය මර්දනය සඳහා වෙනත් විකල්ප ක්‍රියාමාර්ග නොමැති බැවින් පොල් පර්යේෂණ ආයතනයේ උපදෙස් පරිදි 2008 වසරේ සිට රෝගී පොල් ගස් ඉවත් කිරීම ආරම්භ කරන ලදී.

2023 වසර වනවිට පොල් වගාකිරීමේ මණ්ඩලය මගින් ග්‍රාම නිලධාරී වසම් 157ක් පරීක්ෂා කර රෝගී ගස් 22,132ක් හඳුනාගෙන ඇත. එයින් රෝගී ගස් 16,656ක් මේ වනවිට ඉවත්කර ඇත. එසේම, රෝගී ගස් 4,757ක් එන්නත් කර ඇත. වන්දි වශයෙන් ගස් 8,063ක් සඳහා ලබා දී ඇති මුදල වන්නේ රු.මි. 25.129කි.

වගු අංක1.4. 2023 වර්ෂයේදී වැලිගම කොළ මැලවීමේ හා කුණුවීමේ රෝග මර්ධන වැඩසටහනෙහි ප්‍රගතිය

| දිස්ත්‍රික්කය | පරීක්ෂා කළ ග්‍රාම නිලධාරී වසම් ගණන | සලකුණු කළ ගස් ගණන | ඉවත් කළ ගස් ගණන | එන්නත් කළ ගස් ගණන | ගෙවීම් කළ ගස් ගණන |
|---|---|---|---|---|---|
| මාතර | 68 | 5,393 | 12,522 | 3,459 | 6,069 |
| ගාල්ල | 47 | 1,528 | 2,192 | 871 | 942 |
| හම්බන්තොට | 42 | 1,401 | 1,942 | 427 | 1,052 |
| **එකතුව** | **157** | **8,322** | **16,656** | **4,757** | **8,063** |

## 1.1.6 සුදු මැස්සා හානි මර්දන වැඩසටහන

2019 වර්ෂයේදී කෑගල්ල සහ ගම්පහ දිස්ත්‍රික්ක ආශ්‍රිතව ප්‍රධාන වශයෙන් මෙම හානිය වාර්තා වූ අතර පොල් වගාව ආශ්‍රිතව සුදු මැස්සා පළිබෝධ හානිය ඉතා සීඝ්‍රයෙන් ව්‍යාප්ත විය. ඒ අනුව පොල් පර්යේෂණ ආයතනය විසින් දැනට නිකුත් කර ඇති නිර්දේශයන්ට අනුව, පොල් වගාකිරීමේ මණ්ඩලයේ ක්ෂේත්‍ර නිලධාරීන්ගේ මෙහෙයවීමෙන් හානිය පාලනය සඳහා ක්‍රියාමාර්ග ගන්නා ලදී.

ඒ අනුව සුදු මැස්සා හානි මර්දන කටයුතු සඳහා අමාත්‍යාංශීය මූල්‍ය ප්‍රතිපාදන ලෙස රු. මි. 85.5ක මුදලක් වෙන් වූ අතර 2023.12.31 වන දිනට මූල්‍ය ප්‍රගතිය රු. මි. 85.5ක් වේ. එමඟින් බලවේග දියර ඉසින යන්ත්‍ර 500ක ප්‍රමාණයක් මිලදී ගෙන සුදු මැස්සා හානියට ලක්ව ඇති පොල් ගස් ලක්ෂ 08 ක් සඳහා කොහොඹ තෙල් හා සබන් දියර මිශ්‍රණය ඉසීමේ කාර්යය, විශේෂ වැඩසටහනක් ලෙස සිදුකරන ලදී.

වගු අංක 1.5. ප්‍රාදේශීය කාර්යාලය වෙත බලවේග දියර ඉසින යන්ත්‍ර 700 ලබාදීමේ ප්‍රගතිය

| අ/අ | ප්‍රාදේශීය කාර්යාලය | 2022.12.31 දිනට මණ්ඩලය සතුව පැවති යන්ත්‍ර 200 බෙදා දී තිබූ ආකාරය | නව යන්ත්‍ර 500 ප්‍රාදේශීය කාර්යාල සඳහා වෙන්වන ආකාරය (විශේෂ වැඩසටහනෙහි ප්‍රතිපාදන මගින් ලබාගත්) |
|---|---|---|---|
| 1 | ගම්පහ | 38 | 57 |
| 2 | කළුතර | 12 | 36 |
| 3 | කෑගල්ල | 22 | 27 |
| 4 | කුරුණෑගල | 29 | 90 |
| 5 | මාතලේ | 8 | 39 |
| 6 | ගාල්ල | 11 | 30 |
| 7 | මාරවිල | 19 | 33 |
| 8 | කුලියාපිටිය | 18 | 40 |
| 9 | මාතර | 3 | 30 |
| 10 | හම්බන්තොට | 3 | 23 |
| 11 | රත්නපුර | 6 | 26 |
| 12 | අම්පාර | 4 | 10 |
| 13 | මඩකලපුව | 3 | 8 |
| 14 | මොණරාගල | 2 | 12 |
| 15 | අනුරාධපුර | 4 | 7 |
| 16 | පොළොන්නරුව | 3 | 7 |
| 17 | වව්නියාව | 2 | 10 |
| 18 | ත්‍රිකුණාමලය | 3 | 6 |
| 19 | යාපනය | 4 | 9 |
| 20 | පො.සං.පු.ම | 5 | - |
| 21 | ප්‍රධාන කාර්යාලය | 1 | - |
| **එකතුව** | | **200** | **500** |

මෙම යන්ත්‍ර ක්ෂේත්‍ර මට්ටමින් ක්‍රියාත්මක කිරීම සඳහා ශ්‍රමික බලකා සාමාජිකයින්ගේ සේවාව වගාකරුවන් හට ලබාදෙන ලදී. ඒ අනුව ශ්‍රමික බලකා සාමාජිකයින් හට ගෙවීමක් සිදුකර අවශ්‍ය සේවාව ලබාදෙන ලදී. එසේම මෙම වැඩසටහන යටතේ හානියට ලක්වූ පොල් ගස් ලක්ෂ 08ක් ප්‍රතිකාර කිරීම සඳහා අවශ්‍ය කොහොඹ තෙල් ලීටර් 20,000ක්, දියර ඉසින යන්ත්‍ර සඳහා අවශ්‍ය පෙට්‍රල්, ලිහිසි තෙල් සහ ශ්‍රමිකයන් සඳහා වැයවන ප්‍රතිපාදන පොල් වගාකිරීමේ මණ්ඩලය විසින් ලබාදෙන ලදී.

ඒ අනුව 2023.12.31 දින වනවිට දැනුවත් කිරීමේ වැඩසටහන් 2,919ක් පැවැත් වූ අතර එහි ප්‍රතිලාභීන් ගණන 82,634ක් වේ. එසේම සුදු මැස්සා හානියට ලක්ව ඇති පොල් ගස් 949,612ක් සඳහා ප්‍රතිකාර සිදුකරන ලදී.

වගු අංක1.6. 2023.12.31 දිනට සුදු මැස්සාගේ හානිය පාලනයට අදාළ ප්‍රගතිය

| අ/අ | ප්‍රාදේශීය කාර්යාලය | පැවැත්වූ වැඩසටහන් ගණන | ප්‍රතිලාභීන් ගණන | ප්‍රතිකාර කරන ලද ගස් ගණන |
|---|---|---|---|---|
| 1 | ගම්පහ | 445 | 11,036 | 128,862 |
| 2 | කළුතර | 195 | 9,764 | 61,880 |
| 3 | කෑගල්ල | 109 | 5,383 | 135,130 |
| 4 | කුරුණෑගල | 690 | 12,152 | 174,950 |
| 5 | මාතලේ | 250 | 5,116 | 35,048 |
| 6 | ගාල්ල | 401 | 6,422 | 65,231 |
| 7 | මාරවිල | 124 | 6,774 | 200,108 |
| 8 | කුලියාපිටිය | 46 | 2,051 | 102,988 |
| 9 | මාතර | 219 | 9,209 | 13,598 |
| 10 | හම්බන්තොට | 76 | 2,026 | 12,239 |
| 11 | රත්නපුර | 160 | 6,016 | 1,508 |
| 12 | අම්පාර | 33 | 1,063 | 2,083 |
| 13 | මඩකලපුව | 8 | 274 | 4,360 |
| 14 | මොණරාගල | 24 | 957 | 210 |
| 15 | අනුරාධපුර | 24 | 589 | 3,356 |
| 16 | පොළොන්නරුව | 61 | 1,121 | 3,138 |
| 17 | වව්නියාව | 17 | 827 | 2,390 |
| 18 | ත්‍රිකුණාමලය | 9 | 345 | 1,070 |
| 19 | යාපනය | 28 | 1,509 | 1,463 |
| **එකතුව** | | **2,919** | **82,634** | **949,612** |

### 1.1.7. බ්‍රොන්ටිස්පා කෘමි හානි මර්දනය

අග්නිදිග ආසියානු රටවල හා පැසිපික් දූපත්වල බහුල වශයෙන් වාර්තා වූ බ්‍රොන්ටිස්පා කෘමි උවදුර මෙම වසරේ මාර්තු මාසයේ දී ප්‍රථම වරට ශ්‍රී ලංකාවේ වාර්තා වූ අතර පොල් පර්යේෂණ ආයතනයේ නිර්දේශ පරිදි 2023.03.09 දින සිට පොල් වගාකිරීමේ මණ්ඩලය විසින් මර්දන කටයුතු ආරම්භ කරන ලදී.

ඒ අනුව ගාල්ල දොඩන්දූව සිට මාතර කඹුරුගමුව වෙරළබඩ තීරය දක්වා සහ මෙම ප්‍රදේශයේ වෙරළ තීරයේ සිට කි.මී. 01ක් ඇතුළට ගාල්ල දිස්ත්‍රික්කයේ දොඩන්දූව, බූස්ස, ලබුදූව, අහංගම හා පැලැස්ස යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස හා මාතර දිස්ත්‍රික්කයට අයත් මිදිගම හා කප්පරතොට යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල කිලෝමීටර 50ක් දුරට ව්‍යාප්ත වී තිබුණි. වසර අවසන් වනවිට හම්බන්තොට දිස්ත්‍රික්කයේද ස්ථාන කිහිපයකින් බ්‍රොන්ටිස්පා හානිය වාර්තා විය.

මෙම කෘමි උවදුර මර්දන ව්‍යාපෘතිය සඳහා රු. මිලියන 9.7ක් අමාත්‍යාංශීය ප්‍රතිපාදන ලෙස වෙන් වූ අතර 2023.12.31 වන දිනට මූල්‍ය ප්‍රගතිය රු. මිලියන 9.7ක් වේ. 2023.12.31 දින වන විට මාතර, ගාල්ල සහ හම්බන්තොට දිස්ත්‍රික්ක තුනෙහිම රෝගී ගස් 18,829ක් හඳුනාගැනීම සහ රෝගී ගස් 17,927ක් එන්නත් කිරීම සිදුකරන ලදී.

වගු අංක1.7. 2023.12.31 දිනට බ්‍රොන්ටිස්පා ගේ හානිය පාලනයට අදාළ ප්‍රගතිය

| අනු අංකය | ප්‍රාදේශීය කාර්යාලය | ගස් සළකුණු කිරීම | | මුළු සළකුණු කිරීම | ගස් එන්නත් කිරීම | | මුළු එන්නත් කිරීම |
|---|---|---|---|---|---|---|---|
| | | CRI | CCB | | CRI | CCB | |
| 1 | ගාල්ල | 2,214 | 12,707 | 14,921 | 1,206 | 13,715 | 14,921 |
| 2 | මාතර | - | 3,249 | 3,249 | - | 2,347 | 2,347 |
| 3 | හම්බන්තොට | - | 659 | 659 | - | 659 | 659 |
| | එකතුව | **2,214** | **16,615** | **18,829** | **1,206** | **16,721** | **17,927** |

## 1.2. ව්‍යාප්ති වැඩසටහන

කෘෂිකාර්මික සේවා සපයන ආයතනයක් වශයෙන් පොල් වගාකිරීමේ මණ්ඩලය ස්වකීය සේවාලාභියා වන පොල් වගාකරුවා වෙත පොල් වගාවට අදාළව ව්‍යාප්ති තොරතුරු ලබා දීම අනිවාර්යයෙන් කළ යුතුව ඇත. එය මණ්ඩලයේ ප්‍රධාන කාර්යභාරයකි. මෙය සම්බන්ධීකරණය වී ඇත්තේ පහත ආකාරයටයි.

සමස්ත සංයුක්ත සැලැස්මට අනුකූලව වාර්ෂික ක්‍රියාත්මක සැලැස්ම හා අදාළ සංවර්ධන සැලැසුම් මෙන්ම ඒ සඳහා අවශ්‍ය වන ප්‍රතිපාදන වෙන්කිරීමේ සැලැස්ම ද සහකාර සාමාන්‍යාධිකාරී (ව්‍යාප්ති හා සංවර්ධන) විසින් සිදුකෙරෙන අතර එය ව්‍යාප්ති හා සංවර්ධන අංශයේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීගේ එකඟතාවය හා අධීක්ෂණය යටතේ සිදුකෙරේ. ඊට අනුකූලව මෙම සියලු තොරතුරු ලිඛිතව හා චක්‍රලේඛන අනුසාරයෙන් ප්‍රාදේශීය කාර්යාල වෙත යැවෙන අතර ප්‍රාදේශීය කළමනාකරුවන් විසින්

තම බල ප්‍රදේශය තුළ සංවර්ධන හා ව්‍යාප්ති වැඩසටහන් ක්‍රියාත්මක කෙරේ. මෙහි අධීක්ෂණ නිලධාරීන් වශයෙන් ප්‍රාදේශීය කළමනාකරුට අමතරව සහකාර ප්‍රාදේශීය කළමනාකරුවන් හා ගොවිපළ සැලසුම් නිලධාරීන් ක්‍රියාකරනු ලැබේ. ඔවුන්ගේ පූර්ණ අධීක්ෂණය යටතේ වාර්ෂිකව හා මාසිකව පොල් සංවර්ධන නිලධාරීන් හා ක්ෂේත්‍ර නිලධාරීන්ගේ ව්‍යාප්ති කටයුතු සංවිධානය කෙරෙන අතර මේ සඳහා අවශ්‍ය පූර්ණ සහයෝගය, සම්පත් ලබා දීම හා මග පෙන්වීම පොල් සංවර්ධන පුහුණු මධ්‍යස්ථානයෙහි විෂයානුබද්ධ නිලධාරීන් මගින් සිදුකෙරේ.

මේ හැරණු විට ප්‍රධාන කාර්යාලයේ ව්‍යාප්ති හා සංවර්ධන අංශය සහ තොරතුරු ඒකකය ජාතික මට්ටමින් ව්‍යාප්ති සේවය ලබා දීම සිදුකරයි.

2023 වසරේදී පොල් වගාකිරීමේ මණ්ඩලයේ ව්‍යාප්ති වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී ප්‍රධාන වශයෙන් පහත අරමුණු ඉලක්ක කර ගන්නා ලදී.

1. ව්‍යාප්ති වැඩසටහනට සමගාමීව පොල් වගාවේ සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
2. කෘමි හා පළිබෝධ මගින් පොල් වගාවේ සිදුවන හානිය අවම කිරීම.
3. වාණිජ පොල් ඉඩම් සංවර්ධනය කිරීම.
4. බහුවිධ ප්‍රවේශය තුළින් වඩාත් පුළුල් ව්‍යාප්ති සේවාවක් වගාකරුවාට ලබා දීම.

2023 වසරේදී පොල් වගාකිරීමේ මණ්ඩලය කණ්ඩායම් ව්‍යාප්ති වැඩසටහන් 1,215ක් දිවයින පුරා ක්‍රියාත්මක කරන ලදී. ඊට අමතරව ඒක පුද්ගල හමුවීම් 69,740ක් ද සිදුකර ඇත. ඒ අනුව 2023 වර්ෂයේදී සමස්ත වගාකරුවන් හමුවීම් සංඛ්‍යාව 97,035කි. මෙම වැඩසටහන්හී මූල්‍ය ප්‍රගතිය රු.මි 7.20කි.

වගුඅංක1.8. 2023 වර්ෂයේදී ව්‍යාප්ති වැඩසටහන් ප්‍රගතිය

| ප්‍රාදේශීය කාර්යාලය | ඒක පුද්ගල හමුවීම් ප්‍රගතිය | කණ්ඩායම් ව්‍යාප්ති වැඩසටහන් ප්‍රගතිය |
|---|---|---|
| මොණරාගල | 3,779 | 127 |
| මාතර | 4,831 | 40 |
| කුරුණෑගල | 13,096 | 219 |
| කුලියාපිටිය | 6,278 | 46 |
| කෑගල්ල | 3,088 | 55 |
| ගම්පහ | 6,403 | 182 |
| කළුතර | 2,701 | 15 |
| මාරවිල | 4,663 | 61 |
| රත්නපුර | 475 | 89 |
| හම්බන්තොට | 3,020 | 36 |
| අනුරාධපුර | 3,256 | 74 |
| ත්‍රිකුණාමලය | 1,468 | 46 |
| පොළොන්නරුව | 3,705 | 33 |
| අම්පාර | 2,739 | 25 |
| මාතලේ | 995 | 27 |
| ගාල්ල | 2,554 | 26 |
| මඩකලපුව | 3,036 | 25 |
| යාපනය | 1,047 | 19 |
| වව්නියාව | 2,170 | 20 |
| මහනුවර | 436 | 50 |
| එකතුව | **69,740** | **1,215** |

## 1.3 ජාතික පුහුණු වැඩසටහන්

පොල් වගාකිරීමේ මණ්ඩලයේ සමස්ත ජාතික ව්‍යාප්ති වැඩසටහන යටතේ පොල් සංවර්ධන පුහුණු මධ්‍යස්ථානය හරහා ව්‍යාප්ති හා පුහුණු වැඩසටහන් සිදුකෙරේ. පුහුණු වැඩසටහන් යටතේ පොල් වගාකිරීමේ මණ්ඩලයේ නිලධාරීන්, පොල් වගාකරුවන් හා කෘෂිකර්මය හදාරන සිසුන් පුහුණු කිරීම සිදු කරයි.

2023 වර්ෂයේ පොල් සංවර්ධන පුහුණු මධ්‍යස්ථානය මගින් ප්‍රධාන අංශ 03ක් යටතේ පහත දැක්වෙන අයුරින් පුහුණු වැඩසටහන් පවත්වා ඇත.

වගු අංක 1.9. 2023 වර්ෂයේදී පොල් සංවර්ධන පුහුණු මධ්‍යස්ථානය හරහා සිදුකරන ලද ව්‍යාප්ති හා පුහුණු වැඩසටහන් ප්‍රගතිය

| පුහුණු වැඩසටහන | ඇස්තමේන්තුගත | | ප්‍රගතිය | | ප්‍රතිලාභීන් ගණන |
|---|---|---|---|---|---|
| | වැඩසටහන් ගණන | මුදල රු. | වැඩසටහන් ගණන | මුදල රු. | |
| 01. ව්‍යාප්ති නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන් | 10 | 1,500,000.00 | 9 | 773,921.61 | 360 |
| 02. තාක්ෂණික නොවන කාර්ය මණ්ඩලය සඳහා පුහුණු වැඩසටහන් | 5 | 1,000,000.00 | 4 | 395,692.75 | 172 |
| 03. පොල් වගාකරුවන් හා බාහිර පාර්ශව සඳහා පවත්වන පුහුණු වැඩසටහන් | 30 | 1,800,000.00 | 23 | 797,407.29 | 933 |
| 04. පොල් වගා පුහුණු වැඩසටහන් - අච්චුවේලි | 12 | 300,000.00 | 14 | 300,000.00 | 860 |
| 05. පොල් වගා පුහුණු වැඩසටහන් - මැදමුලන | 12 | 300,000.00 | 13 | 89,971.00 | 501 |

### 1.3.1 රෝග හා පළිබෝධ කළමනාකරණ වැඩසටහන

මෙහිදී ප්‍රධාන පළිබෝධ මර්දනය සඳහා ඒකාබද්ධ පළිබෝධ මර්දන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා ඒවාට අවශ්‍ය යෙදවුම් නිෂ්පාදනය හා ලබාදීම සිදු කරන අතර, හානි මර්දන අවස්ථාව අනුව පෞද්ගලික උපදෙස් ලබා දී කඩිනමින් එහි තත්ත්වයන් පාලනය කිරීම සඳහා අවශ්‍ය කටයුතු සලසා දෙනු ලැබේ. මෙම ප්‍රධාන වැඩසටහන් 2023 වර්ෂයේ ද පහත පරිදි ක්‍රියාත්මක කරන ලදී.

වගු අංක 1.10 2023 වර්ෂයේදී රෝග හා පළිබෝධ කළමනාකරණ වැඩසටහන් ප්‍රගතිය

| වැඩසටහන | වැඩසටහන | වැඩසටහන්/ ඒකක ගණන | ප්‍රගතිය | ඇස්තමේන්තුගත මුදල | ප්‍රගතිය |
|---|---|---|---|---|---|
| **01. ඒකාබද්ධ රතු කුරුමිණි කළමනාකරණය** | ඒකාබද්ධ රතු කුරුමිණි මර්දන වැඩසටහන් | 19 | 18 | 7,220,000.00 | 7,140,000.75 |
| | රතු කුරුමිණි පෙරමෝන නිෂ්පාදනය හා බෙදා හැරීම | 19,000 | 18,000 | 1,710,000.00 | 1,620,000.00 |
| | රතු කුරුමිණි පෙරමෝන විකිණීම | 5,000 | 7,057 | - | - |
| | මොනක්‍රොටපස් විකිණීම (ලීටර්) | 1,000 | 1,687.2 | - | - |
| **02. කළු කුරුමිණි මර්දන වැඩසටහන්** | කළු කුරුමිණි පෙරමෝන විකිණීම | 3,700 | 3,692 | | |
| **03. පොල් දළඹු මර්දන වැඩසටහන** | පොල් දළඹු මර්දනය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් | 4 | 1 | 200,000.00 | 74,132.75 |
| | පොල් දළඹු පරපෝෂිත නළ නිෂ්පාදනය හා බෙදාහැරීම | 1,000 | 419 | 100,000.00 | 49,850.00 |
| **06. පොල් මයිටා මර්දන වැඩසටහන්** | මයිටා මර්දන දැනුවත් කිරීමේ වැඩසටහන් | 19 | 13 | 2,510,000.00 | 1,601,551.04 |
| **05. වෙනත් රෝග හා පළිබෝධ මර්දන වැඩසටහන්** | මර්දන වැඩසටහන් | 5 | - | 200,000.00 | - |

## 1.3.2 ව්‍යාප්ති හා ජනමාධ්‍ය වැඩසටහන

පොල් වගාකිරීමේ මණ්ඩලයේ ජාතික ව්‍යාප්ති හා සංවර්ධන වැඩසටහන්වලට සමගාමීව පොල් සංවර්ධන පුහුණු මධ්‍යස්ථානය මගින් ව්‍යාප්ති හා ජනමාධ්‍ය වැඩසටහන ක්‍රියාත්මක කෙරේ. මෙම වැඩසටහන මගින් පොල් වගාකිරීමේ මණ්ඩලය පිළිබඳව හා එමගින් සිදුකරන ව්‍යාප්ති හා සංවර්ධන වැඩසටහන් පිළිබඳව මහජනතාව දැනුවත් කිරීම, පොල් වගාකිරීමේ මණ්ඩලයේ ව්‍යාප්ති නිලධාරීන්ගේ කෘෂිකාර්මික ව්‍යාප්තිය පිළිබඳව දැනුම හා ආකල්ප සංවර්ධනය, පොල් වගාව සඳහා අවශ්‍ය තාක්ෂණික දැනුම බෙදාහැරීම මෙන්ම පොල් වගාකරුවන්ගේ ආකල්ප සංවර්ධනය, පොල් වගාකිරීමේ මණ්ඩලයේ ජාතික ව්‍යාප්ති හා සංවර්ධන වැඩසටහන්වලට අවශ්‍ය ව්‍යාප්ති ආධාරක නිර්මාණය, සැකසුම හා බෙදාහැරීම මෙන්ම අවශ්‍ය අනෙකුත් සහයෝගය ලබාදීම සිදුකරයි.

වගු අංක 1.11. 2023 වර්ෂයේදී පොල් සංවර්ධන පුහුණු මධ්‍යස්ථානය හරහා සිදුකරන ලද ව්‍යාප්ති හා ජනමාධ්‍ය වැඩසටහන් ප්‍රගතිය

| විස්තරය | ඒකක ප්‍රමාණය | මුදල (රු.) |
|---|---|---|
| www.cdtc.lk වෙබ් අඩවිය නඩත්තුව | 1 | 15,200.00 |
| සමාජ මාධ්‍ය තුළ පළකිරීම සඳහා අවශ්‍ය දැන්වීම් | 35 | 0.00 |
| ජාතික මට්ටමේ ප්‍රදර්ශන | 5 | 31,036.90 |
| පුවරු හා බැනර් | 25 | 0.00 |
| වර්ණ අත්පත්‍රිකා මුද්‍රණය | 105,000 | 632,900.00 |
| ප්‍රවෘත්ති පත්‍ර කලාප 2 | 200 | 30,000.00 |
| අක්කර 10ට වැඩි පොල් ඉඩම් හිමියන් සඳහා තාක්ෂණික උපදෙස් - චාරිකා | 20 | 0.00 |
| නව ව්‍යාප්තිකාරකයා පුහුණු මොඩියුල සිංහල භාෂාවට පරිවර්තනය හා මුද්‍රණය - මොඩියුල | 1 | 25,000.00 |
| නව ව්‍යාප්තිකාරකයා පුහුණු මොඩියුල සිංහල භාෂාවට පරිවර්තන ඇගයීම - වැඩමුළු | 1 | 183,875.00 |
| රැස්වීම් සහ උත්සව | 14 | 821,336.08 |

## 1.4 "කප්රුක ආයෝජන" ණය යෝජනා ක්‍රමය

"කප්රුක ආයෝජන" ණය යෝජනා ක්‍රමය, 1998 වසරේ සිට පොල් වගාකිරීමේ මණ්ඩලය විසින් දිවයිනේ ප්‍රමුඛතම මූල්‍යායතනවල සහභාගීත්වය ඇතිව පොල් වගාකරුවන්ගේ ඉඩම් සංවර්ධනයට අවශ්‍ය මූල්‍යාධාර හා තාක්ෂණික මඟපෙන්වීම් ලබාදීම සඳහා ක්‍රියාත්මක කරනු ලබන සහනදායී ණය ක්‍රමයකි.

ණය ක්‍රමය තුළින් වගාකරුවන්ගේ පොල් ඉඩම්වල පූර්ණ ගොවිපල සංවර්ධනය මගින් වාණිජ කෘෂිකර්මය පොල් ඉඩම් ආශ්‍රිතව ප්‍රවර්ධනය කිරීමත්, ඉඩම්වල ඵලදායීතාවය හා ආදායම් ඉහළ නැංවීමත් ඒ තුළින් රටේ සංවර්ධනයට පොල් වගා ක්ෂේත්‍රයේ දායකත්වය වැඩි කිරීමත්, ක්ෂේත්‍රයේ පොල් වගාකරුවන්ගේ හා රැකියා නියුක්තිකයන්ගේ ආදායම් තත්ත්වය ඉහළ නැංවීමත් අපේක්ෂිතය.

මෙම ණය ක්‍රමය සඳහා පොල් වගාකිරීමේ මණ්ඩලය සමඟ මහජන බැංකුව හා ලංකා බැංකුව යන රාජ්‍ය වාණිජ බැංකු, ප්‍රාදේශීය සංවර්ධන බැංකුව, සණස සංවර්ධන බැංකුව හා ජාතික සංවර්ධන බැංකුව යන සංවර්ධන බැංකු හා හැටන් නැෂනල් බැංකුව, සෙලාන් බැංකුව, කොමර්ෂල් බැංකුව, සම්පත් බැංකුව හා යූනියන් බැංකුව යන පෞද්ගලික වාණිජ බැංකු ගිවිසුම් ගත පාර්ශවකරුවන් ලෙස ණය මූල්යාධාර ලබාදීමේ කටයුතු සඳහා දායක වේ.

මෙමගින් පොල් ඉඩම් සංවර්ධනය ආශ්‍රිතව නව වගාව, නැවත වගාව, ඉඩම් පුනරුත්ථාපනය, අතුරුභෝග වගාව, සත්ත්ව පාලනය, ජල සම්පාදන පද්ධති පිහිටුවීම, කෘෂි යන්ත්‍රෝපකරණ මිලදී ගැනීම හා අතුරුවගා තවාන් පිහිටුවීම යන සංවර්ධන කාර්යයන් සඳහා සහනදායී පොළී අනුපාත යටතේ මූල්‍ය පහසුකම් ලබාදෙනු ඇත.

මේ තුළින් 8% ක පොළී අනුපාතය යටතේ ණය මූල්‍යාධාර ලබාදෙන අතර, සාර්ථකව සංවර්ධන කටයුතු සිදුකරන වගාකරුවන් වෙත පළමු වසරේ සිට පසවන වසර දක්වා 100%, 50% වශයෙන් පොළී සහන ප්‍රතිදාන ලබාදේ. එමගින් සඵල පොළී අනුපාතය 3.5% ක් වැනි අඩු පොළී අනුපාතයකට මූල්‍ය පහසුකම් ලබා ගැනීමේ ඉඩ ප්‍රස්ථාව සාර්ථක වගාකරුවන් වෙත සලසා ඇත.

මෙම ණය මූල්‍යාධාර හා ඒකාබද්ධව නොමිලේ තාක්ෂණික උපදේශන සේවා සහ ණය ව්‍යාපෘති සකසාදීම සිදු කෙරෙන අතර, එමගින් වගාකරුවන්ට සංවර්ධන අරමුණු ළඟාකර ගැනීම සඳහා අවශ්‍ය අමතර සේවා සැලසීම ද සිදුවේ.

2023 වර්ෂය තුළ ලබාගත් ප්‍රගතිය අනුව, වගාකරුවන් 586ක් වෙත ඉඩම් අක්කර 3003ක් සංවර්ධනය සඳහා රු.මිලියන 430.49ක් ලබාදී ඇත. ඒ සඳහා මෙම වසර තුළදී රු. මිලියන 368.63ක ප්‍රතිමූල්‍ය පහසුකම් අදාළ මූල්‍යායතන වෙත ලබා දී ඇති අතර, වගාකරුවන් සඳහා රු.මිලියන 16.87ක පොළී සහන ප්‍රතිදාන ගෙවීම් සිදුකර ඇත. මේ අනුව ඉලක්ක හා සාපේක්ෂව සමස්ත ප්‍රගතිය 95.03% පමණ වී ඇත.

වගු අංක 1.12. 2023 වර්ෂයේදී ප්‍රාදේශීය කාර්යාල මට්ටමින් ප්‍රගතිය

| ප්‍රාදේශීය කාර්යාලය | ඉලක්කය (අක්කර) | ප්‍රගතිය (අක්කර) |
|---|---|---|
| මොණරාගල | 96 | 75 |
| මාතර | 110 | 89 |
| කුරුණෑගල | 245 | 221 |
| කුලියාපිටිය | 325 | 260 |
| කෑගල්ල | 65 | 45 |
| ගම්පහ | 320 | 349 |
| කළුතර | 100 | 103 |
| මාරවිල | 480 | 572 |
| රත්නපුර | 160 | 182 |
| හම්බන්තොට | 170 | 171 |
| අනුරාධපුරය | 170 | 181 |
| ත්‍රිකුණාමලය | 100 | 38 |
| පොළොන්නරුව | 95 | 70 |
| අම්පාර | 170 | 119 |
| මාතලේ | 90 | 62 |
| ගාල්ල | 150 | 153 |
| මඩකලපුව | 100 | 56 |
| යාපනය | 132 | 180 |
| වව්නියාව | 62 | 57 |
| මහනුවර | 20 | 20 |
| **එකතුව** | **3160** | **3003** |

**වගු අංක 1.13. 2023 වර්ෂයේදී ප්‍රතිමූල්‍ය පහසුකම් මූල්‍ය ආයතන වෙත ලබාදීමේ ප්‍රගතිය**

| බැංකුව | ප්‍රතිමූල්‍ය වටිනාකම(.රු) |
|---|---|
| ලංකා බැංකුව | 84,734,978.00 |
| මහජන බැංකුව | 57,301,316.00 |
| ප්‍රාදේශීය සංවර්ධන බැංකුව | 130,191,880.00 |
| කොමර්ෂල් බැංකුව | 51,920,200.00 |
| සම්පත් බැංකුව | 7,400,750.00 |
| සෙලාන් බැංකුව | 12,666,231.00 |
| හැටන් නැෂනල් බැංකුව | 20,691,750.00 |
| යූනියන් බැංකුව | 900,000.00 |
| සණස සංවර්ධන බැංකුව | 1,325,000.00 |
| ජාතික සංවර්ධන බැංකුව | 1,500,000.00 |
| එකතුව | **368,632,105.00** |

“කප්රුක ආයෝජන” ණය ක්‍රමය පොල් වගාකරුවන් අතර හා විවිධ අධිකාරීන් අතර ඉහළ පිළිගැනීමට ලක් වී ඇති අතර, ඒ තුළ වැඩිවෙමින් පවතින ණය ඉල්ලුම සපුරාගැනීම සඳහා ප්‍රමාණවත් මූල්‍ය ප්‍රතිපාදන ලබාගැනීමත්, වැඩිවන සේවා අවශ්‍යතා සපුරාලීම සඳහා අවශ්‍ය මානව සම්පත් ප්‍රමාණවත්ව ලබා ගැනීමත්, ඒ තුළින් වගාකරුවන්ගේ අපේක්ෂිත සේවාවන් ප්‍රශස්ත මට්ටමින් ලබා දීමත් ඉදිරි සංවර්ධන අරමුණු අතර වේ.

# 2.0 ආදර්ශ පොල් උයන් හා තවාන් සංවර්ධන අංශය මගින් ක්‍රියාත්මක කරන ලද වැඩසටහන්

## 2.1 ආදර්ශ පොල් උයන් අංශය

පොල් වගාකිරීමේ මණ්ඩලය සතුව ආදර්ශ පොල් උයන් දොළහක් (12) පවතින අතර, එම ආදර්ශ පොල් උයන්වලින් වයඹ පළාත තුළ ආදර්ශ පොල් උයන් අටක් (8) ද, ආදර්ශ පොල් උයන් තුනක් (3)ක් නැගෙනහිර පළාත තුළ හා එකක් (1) උතුරු පළාත තුළ ද පිහිටා තිබේ.

**වගු අංක 2.1. මණ්ඩලීය ආදර්ශ පොල් උයන් පිළිබඳ තොරතුරු**

| ආදර්ශ පොල් උයන | පිහිටි දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | කෘෂි දේශගුණික කලාපය | භූමි ප්‍රමාණය (අක්කර) |
|---|---|---|---|---|
| ලේනව | කුරුණෑගල | මැල්සිරිපුර<br>ඉබ්බාගමුව | අතරමැදි වියළි | 483 |
| ඩේසිවැලි | කුරුණෑගල | වැළඩ<br>මාවතගම | අතරමැදි තෙත් | 306 |
| ගර්ට්ලන්ඩ් | කුරුණෑගල | කදානේ ගෙදර<br>පන්නල | අතරමැදි තෙත් | 405 |
| නාගන්සෝල | කුරුණෑගල | වන්නි රස්නායකපුර | අතරමැදි වියළි | 406 |
| රන්දෙනිය | කුරුණෑගල | වාරියපොල | අතරමැදි වියළි | 347 |
| මහයාය | කුරුණෑගල | මාකඳුර<br>පන්නල | අතරමැදි වියළි | 331 |
| පලෙයි | කිලිනොච්චි | තර්මකර්ණි<br>පච්චිලෙයිපලෙයි | පහතරට වියළි | 492 |
| කොරෙයි | අම්පාර | තිරුක්කෝවිල් | පහතරට වියළි | 465 |
| බෝපිටිය | කුරුණෑගල | කු/බෝපිටිය<br>පන්නල | අතරමැදි තෙත් | 142 |
| පාසිකුඩා | මඩකලපුව | කෝරලේපත්තු<br>නැගෙනහිර කල්කුඩා | පහතරට වියළි | 238 |
| කොහොඹාන | අම්පාර | උහන | පහතරට වියළි | 152 |
| මුන්දලම | පුත්තලම | මුන්දලම | අතරමැදි වියළි | 14 |
| එකතුව | | | | 3,781 |

2023 වර්ෂයේ ගෙඩි 4,986,561 පොල් අස්වැන්නක් ආදර්ශ පොල් උයන් මගින් ලබා ඇත. 2022 වර්ෂයේ ලැබූ අස්වැන්න ගෙඩි 6,508,111වන අතර එයට සාපේක්ෂව 2023 වර්ෂයේ ලැබූ අස්වැන්න ගෙඩි 1,521,550කින් අඩු වී ඇත. වසර කිහිපයක් පොහොර නොයෙදීම, දේශගුණික තත්ත්වය හා සුදු මැස්සා /මයිටා වැනි පළිබෝධ හානි ඒ සඳහා බලපා ඇත.

මෙම ආදර්ශ පොල් උයන් සියල්ලෙහිම ප්‍රධාන බෝගය ලෙස පොල් වගාව සිදුකර ඇති අතර, මෙම ආදර්ශ පොල් උයන්වල ඵලදායීතාවය ඉහළ නැංවීම සඳහා පොල් වගාව සමඟ අතුරු වගාව, සතත්ත්ව පාලනය සිදු කරනු ලැබේ. ඊට අමතරව ආදායම් උත්පාදනය ඉහළ නැංවීමේ අරමුණ ඇතිව පොල් ආශ්‍රිත අගය වැඩිකළ නිෂ්පාදන සිදුකරනු ලබයි. ඒ අනුව කොප්පරා නිෂ්පාදනය, කොහු නිෂ්පාදනය, පොල් කටු ආශ්‍රිත නිෂ්පාදන, පොල් ලෙලි කැබලි නිෂ්පාදනය, පොල් තෙල් නිෂ්පාදනය, පොල් පැළ නිෂ්පාදනය සිදුකරනු ලබයි. ඊට අමතරව ආදර්ශ පොල් උයන්වල පිහිටීම අනුව හා පොල් වගාවේ උන්නතිය හා සබැඳි ව්‍යාපෘති ආරම්භකර ඇත. එම ව්‍යාපෘති නම් විලෝපික මයිටා නිෂ්පාදනය, කප්තුරුපාය අලෙවිසැල් පවත්වාගෙන යාම, නිලධාරී/සංචාරක බංගලා පිහිටුවීම වේ.


මෙම ව්‍යාපෘති මගින් ආදායම් උත්පාදනය ඉහළ නැංවීම ප්‍රධාන අරමුණ වූ අතර, ඊට අමතරව මෙම ආදර්ශ පොල් උයන් වගාකරුවන්, විශ්ව විද්‍යාල සිසුන්, පොල් ආශ්‍රිත පාඨමාලා හදාරන සිසුන්, රාජ්‍ය හා පෞද්ගලික ආයතන සේවක මහතුන්, කෘෂිකාර්මික සංවිධානවල සාමාජිකයන් හා පාසල් සිසුන් සඳහා විවිධ පුහුණු වැඩසටහන් පැවැත්වීම සහ අවශ්‍ය දැනුම ලබාදීම සේවාවක් ලෙස සැපයීම සිදුකරනු ලබයි.

මෙම වර්ෂයේදී පොල් වගාකිරීමේ මණ්ඩලය සතු ආදර්ශ පොල් උයන් 12න් උපයා ඇති ආදායම රු.මි.380.40ක් වේ. මෙම ආදර්ශ පොල් උයන් 12 හි වියදම රු.මි.317.27ක් වන අතර ඒ අනුව ආදර්ශ පොල් උයන් 12 හි ලාභය රු.මි.63.13ක් වේ. ඉන් ආදර්ශ පොල් උයන් අංශයට අදාළ වියදම වන රු.මි. 42.737 අඩුකළ පසු ආදර්ශ පොල් උයන් අංශයේ සමස්ත ශුද්ධ ලාභය රු.මි.20.39ක් වේ.


වගු අංක 2.2. ආදර්ශ පොල් උයන්වල පොල් අස්වැන්න, ආදායම, වියදම හා ලාභය (වෙන්දේසියේ අළෙවිය, මාළු පොල් අළෙවිය බීජ පොල් වටිනාකම සහ කොප්පරා වටිනාකම ඇතුළත්)

| ආදර්ශ පොල් උයන | වාර්ෂික ඉලක්කය | වාර්ෂික නිෂ්පාදනය | ආදායම | වියදම | ලාභය | COP | NSA | ගෙඩියක ලාභය |
|---|---|---|---|---|---|---|---|---|
| | (ගෙඩි) | (ගෙඩි) | (රු.) | (රු.) | (රු.) | | | |
| ලේනව | 936,000 | 890,430 | 52,971,202 | 26,685,760 | 26,285,442 | 29.97 | 59.49 | 29.52 |
| ඩෙසිවැලි | 880,000 | 600,102 | 43,093,810 | 25,028,860 | 18,064,950 | 41.71 | 71.81 | 30.10 |
| ගර්ට්ලන්ඩ් | 821,100 | 658,928 | 42,034,590 | 21,352,628 | 20,681,962 | 32.41 | 63.79 | 31.39 |
| නාගන්සෝල | 690,000 | 527,614 | 54,196,613.17 | 32,325,134.61 | 21,871,479 | 61.27 | 102.72 | 41.45 |
| රත්දෙනිය | 740,000 | 551,060 | 32,456,645 | 19,559,722 | 12,896,923 | 35.49 | 58.90 | 23.40 |
| මහයාය | 930,000 | 657,208 | 39,063,973 | 20,792,659 | 18,271,314 | 31.64 | 59.44 | 27.80 |
| පලෙයි | 270,000 | 202,820 | 12,124,857 | 7,174,193 | 4,950,664 | 35.37 | 59.78 | 24.41 |
| කොරෙයි | 325,000 | 192,965 | 12,427,850 | 8,700,948 | 3,726,902 | 45.09 | 64.40 | 19.31 |
| බෝපිටිය | 325,000 | 227,685 | 12,838,096 | 10,679,818 | 2,158,278 | 46.91 | 56.39 | 9.48 |
| පාසිකුඩා | 260,000 | 166,998 | 10,773,003 | 8,966,080 | 1,806,923 | 53.66 | 64.48 | 10.82 |
| කොහොඹාන | 244,000 | 249,999 | 16,508,201 | 7,352,813 | 9,155,388 | 29.41 | 66.03 | 36.62 |
| මුන්දලම | 75,000 | 60,752 | 4,085,297 | 2,722,458 | 1,362,839 | 44.81 | 67.25 | 22.43 |
| එකතුව | 6,496,100 | 4,986,561 | 332,574,137.17 | 191,341,073.61 | 141,233,064 | 38.54 | 58.34 | 19.80 |

රූපය 2.1. වාර්ෂික පොල් ගෙඩි ඉලක්කය ,නිෂ්පාදනය පහත ප්‍රස්තාරයේ දක්වා ඇත.



**රූපය 2.2. ආදර්ශ පොල් උයන්වල වාර්ෂික පොල් ආදායම, වියදම හා ලාභය පහත ප්‍රස්තාරයේ දක්වා ඇත.**




ආදර්ශ පොල් උයන්වල 2023 වර්ෂයේදී කොප්පරා කි.ග්‍රෑ 87,307ක් නිෂ්පාදනය කරන ලද අතර එමගින් රු.29,306,026.00ක ආදායමක් ලබාගෙන ඇත. වාර්ෂික වියදම රු.7,679,594.00ක් වූ අතර රු.21,626,432.00ක ලාභයක් කොප්පරා නිෂ්පාදනයෙන් ලබාගෙන ඇත.

එක් එක් ආදර්ශ පොල් උයන් මගින් අඟුරු කි්.ග්‍රෑ 20,865ක් නිෂ්පාදනය කරන ලද අතර, එමගින් රු.1,529,639.00ක ආදායමක් ලබාගෙන ඇත. වාර්ෂික වියදම රු.240,161.00ක් වූ අතර ලාභය රු.1,289,478.00 අඟුරු නිෂ්පාදනය මගින් ලබාගෙන ඇත.

## 2.1.2. බීජ පොල් නිෂ්පාදනය

2023 වර්ෂයේදී ආදර්ශ පොල් උයන් මගින් බීජ පොල් 640,813ක් නිෂ්පාදනය කරන ලද අතර, ආදර්ශ පොල් උයන් අනුව එහි විස්තර වගුව 2.3 මගින් දක්වා ඇත.

වගු අංක 2.3. 2023 වර්ෂයේ ආදර්ශ පොල් උයන්වල නිෂ්පාදනය කර ඇති බීජ පොල් ප්‍රමාණය

| ආදර්ශ පොල් උයන | නිෂ්පාදනය කළ බීජ පොල් ප්‍රමාණය (ගෙඩි) |
|---|---|
| ලේනව | 107,473 |
| ඩෙසිවැලි | 65,668 |
| ගර්විලන්ඩ් | 64,543 |
| නාගන්සෝල | 51,989 |
| රන්දෙනිය | 61,301 |
| මහයාය | 51,430 |
| පලෙයි | 43,000 |
| කොරෙයි | 46,000 |
| බෝපිටිය | - |
| පාසිකුඩා | 57,700 |
| කොහොඹාන | 72,059 |
| මුන්දලම | 19,650 |
| **එකතුව** | **640,813** |

## 2.1.3 පොල් ලෙලි චිප්ස් නිෂ්පාදනය

පැළ නිෂ්පාදනය සඳහා භාවිතා වන කොහුබත් වෙනුවට ආදේශකයක් ලෙස පොල් ලෙලි චිප්ස් භාවිතා කළ හැක. කොහුබත් මිලට ගැනීම සඳහා වාර්ෂිකව වැය වන මුදල අවම කිරීම සඳහා ආදර්ශ පොල් උයන් සතු පොල් ලෙලි වලින් චිප්ස් කැබලි කපා කොහුබත් වෙනුවට භාවිතා කිරීම සිදුකරන අතර, මුදලට අලෙවි කිරීමත් සිදු කරනු ලබයි.

2023 වර්ෂයේ පොල් වගාකිරීමේ මණ්ඩලයේ නාගන්සෝල ආදර්ශ පොල් උයනේ හා ලේනව ආදර්ශ පොල් උයනේ පොල් ලෙලි කැබලි නිෂ්පාදන ආදායම රු. 1,800,200.00ක් සහ එහි වියදම රු. 734,194.52 වූ අතර ලාභය රු. 1,066,005.48ක් ලබාගෙන ඇත.

2023 වර්ෂයේදී ක්‍රියාත්මක වූ කොහු නිෂ්පාදන ව්‍යාපෘතිය ආදර්ශ පොල් උයන් 03 ක ක්‍රියාත්මක වූ අතර, නිෂ්පාදිත කොහු කි.ග්‍රෑ 6438ක් සහ කොහුබත් කියුබ් 276ක් වේ. එමගින් රු. 3,088,475.00ක ආදායමක් හා එහි වියදම රු. 1,101,573.00ක් ද රු. 1,986,902.00 ලාභයක් ද උපදවා ඇත.

## 2.1.4 පොල් වගාකිරීමේ වැඩසටහන

(නව වගාව, යටි වගාව, පුරප්පාඩු සිටුවීම)

2023 වර්ෂයේ අලුතින් පොල් වගාකිරීම, නැවත / යටි වගාකිරීම හා පොල් වගාවේ පුරප්පාඩු සිටුවීම මගින් පොල් වගාව වැඩි කිරීමත් හා පවතින පොල් වගාවේ ගහන ඝනත්වය වැඩි කිරීමත් සිදු කරන ලදී.

ආදර්ශ පොල් උයන් වල වගාකළ නව වගා ප්‍රමාණය ද ඇතුලුව සමස්තයක් ලෙස 2023 වසරේදී අක්කර 25ක පොල් පැළ 2,750ක් අලුතින් වගාකර ඇත. මණ්ඩලයේ සියලුම ආදර්ශ පොල් උයන් වල පුරප්පාඩු සිටවූ පැළ හා යටි වගා කර ඇති පැළ ගණන 50,270ක් වේ.

## 2.1.5 ආදර්ශ පොල් උයන් වල ක්ෂේත්‍ර ක්‍රියාකාරකම්

ආදර්ශ පොල් උයන්වල ඵලදරන වගාවේ සහ පැළ වගාවේ සිදු කරනු ලබන ක්ෂේත්‍ර ක්‍රියාකාරකම් මගින් පොල් වගා භූමියේ භෞතික, ජීව විද්‍යාත්මක හා රසායනික තත්ත්වය වැඩිදියුණු කිරීමට අපේක්ෂා කෙරේ. එසේම පස සෝදායාම වැළැක්වීමත්, පසේ තෙතමනය සංරක්ෂණය කිරීමත් මෙම කාර්යයන්ගෙන් සිදුකරනු ලබන අතර, රෝග පළිබෝධ මර්දනය මගින් වගාවේ ආරක්ෂාව තහවුරු කිරීමත් සිදු කෙරේ. 2023 වර්ෂයේ එක් එක් ක්ෂේත්‍ර ක්රියාකාරකම්වල ප්‍රගතිය පහත දැක්වේ.

### 2.1.5.1 මාර්ග හා බෝක්කු

සියලුම ආදර්ශ පොල් උයන්වල මීටර් 19,340ක මාර්ග හා බෝක්කු අළුත්වැඩියා කර ඇති අතර, ආදර්ශ පොල් උයන් අනුව ප්‍රගතිය මීටර් 19,340ක් වේ.

ආදර්ශ පොල් උයන්වල ආරක්ෂාව සඳහා සිදු කරනු ලබන වැටවල් සකස් කිරීම මීටර් 43,434 ක් වේ.

### 2.1.5.2 වල් මර්දනය

ආදර්ශ පොල් උයන්වල වල් මර්දනය කම්කරුවන් මගින්,රසායනික ද්‍රව්‍ය මගින්, යාන්ත්‍රික ක්‍රම මගින් හා සතුන් මගින් යන ආකාර 04 මගින් සිදුකරනු ලබයි. වසර පුරා වරින්වර සිදුකරන ලද වල් මර්දනය අක්කර 5,384ක් වේ.

### 2.1.5.3 කාණු යෙදීම, ලෙලි වැලලීම

පොල් වගාවේ පවතින තෙතමනය සංරක්ෂණය කිරීම සඳහා සමෝච්ඡ කාණු යෙදීම හා ලෙලි වලවල් යෙදීමත් වැඩිපුර ජලය බැසයාම සඳහා ජල බස්නා කාණු යෙදීමත් සිදුකරනු ලබන අතර 2023 වර්ෂයේ සිදුකරන ලද කාණු යෙදීම, අළුත්වැඩියාව හා ලෙලි වලවල් යෙදීමේ ප්‍රගතිය දක්වා ඇත.

වගු අංක 2.4 පොල් වගාවේ කාණු යෙදීම හා ලෙලි වැලලීම.

| ආදර්ශ පොල් උයන් | සමෝච්ජ කාණු යෙදීම හා අළුත්වැඩියාව (මීටර්) | ජල බස්නා කාණු යෙදීම හා අළුත්වැඩියාව (මීටර) | ලෙලි වැලලීම (වලවල් ගණන) |
|---|---|---|---|
| ලේනව | - | - | 750 |
| ඬේසිවැලි | 2,775 | - | 582 |
| ගර්විලන්ඩ් | - | 909 | 35 |
| නාගන්සෝල | - | 1,008 | 300 |
| රන්දෙනිය | 1,370 | - | 741 |
| මහයාය | - | - | 800 |
| පලෙයි | - | - | 300 |
| කොරෙයි | - | 2,240 | 522 |
| බෝපිටිය | - | - | - |
| පාසිකුඩා | - | - | 60 |
| කොහොඹාන | - | 1,060 | 122 |
| මුන්දලම | 525 | - | 28 |
| එකතුව | 4,670 | 5,217 | 4,240 |

### 2.1.5.4. ආස්තරණ යෙදීම ,ආවරණ බෝග වගාව හා සී සෑම

2023 වර්ෂයේදී ආදර්ශ පොල් උයන්වල තෙතමනය සංරක්ෂණය සඳහා පොල් ගස වටා ආස්තරණ යෙදීම එක් වසරක් තුළ අවස්ථා කිහිපයකදී සිදු කරනු ලබයි. එයට අමතරව පොල් වගාවේ ආවරණ බෝග වගාව හා සී සෑම ද සිදු කරනු ලබයි. එය පහත පරිදි වේ.

- ආදර්ශ පොල් උයන් වල සී සෑම (අක්කර) - 1,909
- ආස්තරණ යෙදීම ගස් - 121,461
- ආවරණ බෝග වගාව (අක්කර) - 960

### 2.1.5.5 කාබනික පොහොර යෙදීම.

පසේ භෞතික තත්ත්වය වැඩිදියුණු කිරීමත්, එහි පෝශක සංඝටක වැඩි කිරීමත්, පාංශු ජීවීන්ගේ ක්‍රියාකාරීත්වය වර්ධනය කිරීමත් මගින් පොල් වගාවේ පාංශු තත්ත්වය දිගුකාලීනව සංවර්ධනය සඳහා වගාවට කාබනික පොහොර යෙදීම සිදු කරයි. ප්‍රදේශයේ සුලභතාවය අනුව කාබනික පොහොර ලෙස

කුකුළු පොහොර, ගොම පොහොර, එළු/බැටළු පොහොර හා කොම්පෝස්ට් යෙදීම සිදු කරයි. ආදර්ශ පොල් උයන් සඳහා කාබනික පොහොර යෙදීමේ ප්‍රගතිය අනුව කාබනික පොහොර යෙදූ ගස් ගණන 5,614 සහ කි්‍ර.ග්‍රෑ ප්‍රමාණය 62,140 වේ.

### 2.1.6 අතුරු වගා වැඩසටහන

පොල් වගාව සිදුකරනු ලබන භූමිවල පොල් වගාවේ පරතරය හේතුවෙන් භූමි භාවිතයෙන් 2/3 ඉඩ ප්‍රමාණයක් ඉතිරිවන අතර, මෙම ඉඩකඩ ප්‍රමාණය තුළ වෙනත් වගා සිදුකළ හැක. අවුරුදු 05ට අඩු හා අවුරුදු 35ට වැඩි පොල් වගාව තනි වගාවක් ලෙස සිදුකරන භූමිවල අතුරු වගාකිරීම සිදුකිරීමේ හැකියාව ඇත. ඒ අනුව එම ඉඩකඩ ප්‍රමාණය භාවිතා කොට කෙටිකාලීන බෝග හා දිගු කාලීන බෝග අලුතින් වගාකිරීමත් පවතින අතුරු වගා නඩත්තු කිරීමත් සිදුකර ඇත. අතුරු වගා ලෙස කෙටි කාලීන එළවළු වර්ග, අල වර්ග, ඖෂධ වර්ග, කුළුබඩු වර්ග, මාශ බෝග, ධාන්‍ය හා පලතුරු බෝග වගාකර ඇත.

### 2.1.7 වී වගාව

ලේනව, රත්දෙනිය, ගර්විලන්ඩ්, මහයාය, කොහොඹාන හා නාගන්සෝල ආදර්ශ පොල් උයන්වල වී වගා වැඩසටහන 2023 වර්ෂයේදී ක්‍රියාත්මක විය. ඉන් අක්කර 72 පර්චස් 84 ක අඳ ගොවීන් මගින් වී වගාකර ඇත. සමස්ත වී වගා ආදායම රු. 2,989,409.00 වියදම රු. 552,180.00 කී. එහි ලාභය රු. 2,437,228.00ක් වන අතර නිෂ්පාදිත වී ප්‍රමාණය කි.ග්‍රෑ. 31,543ක් වේ.

### 2.1.8 බීජ පොල් තවාන් කිරීම

2023 වර්ෂයේ ආදර්ශ පොල් උයන්වල බීජ පොල් තවාන් කිරීමේ ප්‍රගතිය පහත වගුවේ දක්වා ඇත.

**වගුව 2.5. බීජ පොල් තවාන් කිරීමේ ප්‍රගතිය**

| ආදර්ශ පොල් උයන | බීජ පොල් ලැබීම හා තවාන් කිරීම |
|---|---|
| | **බඳුන් පැළ** |
| ලේනව | - |
| ඩේසිවැලි | - |
| ගර්විලන්ඩ් | - |
| නාගන්සෝල | 6,370 |
| රත්දෙනිය | - |
| මහයාය | 2,780 |
| පලෙයි | 5,250 |
| කොරෙයි | - |
| බෝපිටිය | - |
| පාසිකුඩා | 22,750 |
| කොහොඹාන | 7,048 |
| මුන්දලම | - |
| එකතුව | **44,198** |

2023 වර්ෂයේදී ආදර්ශ පොල් උයන්වල, පොල් පැළ තවාන්වල පැළ නිෂ්පාදන ප්‍රගතිය 2.6 වගුවෙහි දක්වා ඇත.

**වගුව අංක 2.6. පොල් පැළ නිෂ්පාදන ප්‍රගතිය**

| ආදර්ශ පොල් උයන | බිම් පැළ | | බඳුන් පැළ | | එකතුව |
|---|---|---|---|---|---|
| | **යල කන්නය** | **මහ කන්නය** | **යල කන්නය** | **මහ කන්නය** | |
| **ලේනව** | - | - | - | - | - |
| **ඩේසිවැලි** | - | - | - | - | - |
| **ගර්ට්ලන්ඩ්** | - | - | - | - | - |
| **නාගන්සෝල** | - | - | 6,370 | - | 6,370 |
| **රන්දෙනිය** | - | - | - | - | - |
| **මහයාය** | 3,251 | - | - | 2,780 | 6,031 |
| **පලෙයි** | - | - | - | - | - |
| **කොරෙයි** | 5,587 | 32,694 | 14,396 | 1,340 | 54,017 |
| **බෝපිටිය** | - | - | - | - | - |
| **පාසිකුඩා** | - | - | 6,000 | 1,000 | 7,000 |
| **කොහොඹාන** | - | - | - | 7,048 | 7,048 |
| **මුන්දලම** | - | - | - | - | - |
| එකතුව | **8,838** | **32,694** | **26,766** | **12,168** | **80,466** |

ආදර්ශ පොල් උයන් මගින් 2023 වර්ෂයේදී පොල් පැළ නිකුත් කිරීමේ ප්‍රගතිය වගුව 2.7හි හා ආදායම්, වියදම් ප්‍රගතිය වගු අංක 2.8 හි දක්වා ඇත.

**වගුව අංක 2.7 පැළ නිකුත් කිරීම් ප්‍රගතිය**

| ආදර්ශ පොල් උයන | නිකුත් කල පොල් පැල ගණන | | එකතුව |
|---|---|---|---|
| | **බිම් පැල** | **බඳුන් පැල** | |
| **ලේනව** | 78,965 | 30,374 | 109,339 |
| **ඩේසිවැලි** | 61,144 | 32,584 | 93,728 |
| **ගර්වලන්ඩ්** | 30,122 | 13,012 | 43,134 |
| **නාගන්සෝල** | 5,200 | 38,561 | 43,761 |
| **රන්දෙනිය** | 587 | 25,784 | 26,371 |
| **මහයාය** | 25,094 | 306 | 25,400 |
| **පලෙයි** | 93,567 | 9,139 | 102,706 |
| **කොරෙයි** | 34,981 | 2,671 | 37,652 |
| **බෝපිටිය** | 20,659 | 3,961 | 24,620 |
| **පාසිකුඩා** | 135,315 | 6,966 | 142,281 |
| **කොහොඹාන** | 67,206 | 46,824 | 114,030 |
| **මුන්දලම** | 25,894 | 1,346 | 27,240 |
| එකතුව | **578,734** | **211,528** | **790,262** |

**වගුව 2.8 පොල් පැළ නිෂ්පාදන ආදායම, වියදම හා ලාභය**

| ආදර්ශ පොල් උයන | ආදායම (රු.) | වියදම (රු.) | ලාභය (රු.) |
|---|---|---|---|
| **ලේනව** | 17,246,540.00 | 1,245,061.26 | 16,001,478.74 |
| **ඩේසිවැලි** | 20,756,875.00 | 952,480.87 | 19,804,394.13 |
| **ගර්වලන්ඩ්** | 6,313,324.00 | 683,617.80 | 5,629,706.20 |
| **නාගන්සෝල** | 12,489,925.00 | 1,073,400.00 | 11,416,525.00 |
| **රන්දෙනිය** | 7,837,925.00 | - | 7,837,925.00 |
| **මහයාය** | 4,933,675.00 | 133,445.00 | 4,800,230.00 |
| **පලෙයි** | 19,115,925.00 | 1,551,185.00 | 17,564,740.00 |
| **කොරෙයි** | 6,922,975.00 | 643,851.07 | 6,279,123.93 |
| **බෝපිටිය** | 4,768,525.00 | 267,209.00 | 4,501,316.00 |
| **පාසිකුඩා** | 19,710,600.00 | 925,646.00 | 18,784,954.00 |
| **කොහොඹාන** | 14,382,000.00 | 2,039,806.00 | 12,342,194.00 |
| **මුන්දලම** | 4,935,250.00 | 167,302.00 | 4,767,948.00 |
| **එකතුව** | **139,413,539.00** | **9,683,004.00** | **129,730,535.00** |

## 2.1.9 සත්ත්ව පාලන වැඩසටහන

ඒකීය බෝගයක් ලෙස පොල් වගාකිරීමට වඩා පොල් වගාව සමඟ අතුරු වගාකිරීම හා සත්ත්ව පාලනය කිරීම මගින් ආදර්ශ පොල් උයනේ භූමි ඵලදායීතාවය ඉහළ නැංවීම සිදු කරයි. ආදර්ශ පොල් උයනේ පවතින විභවය අනුව තෝරාගත් සත්ව පාලන ව්‍යාපෘති ක්‍රියාවට නංවන අතර, ඒ යටතේ එළ ගවයන්, මී ගවයන්, එළුවන් හා බැටළුවන් ඇති කරනු ලබයි. සත්ව නිෂ්පාදන වැඩසටහන යටතේ දියර කිරි, මුදවපු කිරි, යෝගට් ප්‍රධාන වශයෙන් ද කිරි ටොෆී සුළු වශයෙන් ද නිෂ්පාදනය කර අලෙවි කරනු ලබන අතර, අභිජනන කටයුතු සඳහා ගොවීන්ට සහන මිලට සතුන් අලෙවි කරනු ලැබේ. ආදර්ශ පොල් උයනේ කාබනික පොහොර අවශ්‍යතාවයෙන් යම් ප්‍රමාණයක්ද මේ මගින් සපයනු ලැබේ. විශ්ව විද්‍යාල සිසුන්ගේ ප්‍රායෝගික පරීක්ෂණ කටයුතු සඳහා ද සත්ව පාලන ව්‍යාපෘති උපකාරී වී ඇත.

**වගුව 2.9 - 2023.12.31 දිනට සත්ව පාලන ව්‍යාපෘතිවල සමස්ත ආදායම ,වියදම හා ලාභය**

| සත්ව පාලන ව්‍යාපෘතිය | ආදායම (රු.) | වියදම (රු.) | ලාභය (රු.) |
|---|---|---|---|
| | 15,579,059.00 | 7,530,167.00 | 8,048,892.00 |

## 2.1.10 විලෝපික මයිටා නිෂ්පාදනය හා ආදර්ශ පොල් උයන්වල භාවිතය

ආදර්ශ පොල් උයන්වල ඇති මයිටාවන්ගේ හානිය නිසා අස්වැන්නේ පැහැදිලි අඩුවීමක් සිදුවේ. ගෙඩි කුඩාවීම, ගෙඩිවල ගුණාත්මකභාවය අඩුවීම හා අස්වැන්න අඩුවීම මයිටා හානිය නිසා සිදුවේ. එසේම ලෙලි වල ප්‍රමාණය කුඩා වීම හේතුවෙන් ලෙලි ඉවත් කිරීම අපහසු වීමත්, ලෙලිවල ආදායම අඩුවීමත් හේතුවෙන් පොල් අස්වැන්නේ ආදායම අඩුවීම සිදුවේ. මයිටාවන් ජෛව විද්‍යාත්මක ක්‍රම මගින් මර්දනය සඳහා විලෝපික මයිටාවන් භාවිතා කරනු ලබන අතර මණ්ඩලයේ ආදර්ශ පොල් උයන් හා තවාන් සංවර්ධන අංශය යටතේ ක්‍රියාත්මක වූ රසායනාගාර 10ක් ඇත.

ආදර්ශ පොල් උයන්වල මයිටා මර්දනය සඳහා විලෝපික මයිටාවන් භාවිතා කළ අතර, එහි ප්‍රගතිය වගුව 2.10 හි දක්වා ඇත.

වගුව 2.10 ආදර්ශ පොල් උයන්වල විලෝපික මයිටාවන් භාවිතය

| ආදර්ශ පොල් උයන | යෙදූ විලෝපික මයිටා පැකට් ගණන |
|---|---|
| **ලේනව** | - |
| **ඩේසිවැලි** | 14,842 |
| **ගර්ට්ලන්ඩ්** | 8,000 |
| **නාගන්සෝල** | 5,050 |
| **රන්දෙනිය** | 1,700 |
| **මහයාය** | 3,000 |
| **පලෙයි** | 1,376 |
| **කොරෙයි** | 4,220 |
| **බෝපිටිය** | 4,500 |
| **පාසිකුඩා** | 2,600 |
| **කොහොඹාන** | 1,100 |
| **මුන්දලම** | - |
| එකතුව | **46,388** |

## 2.1.11 කප්තුරුපාය අලෙවිසැල් ව්‍යාපෘතිය

පොල් වගාකිරීමේ මණ්ඩලය මගින් නිෂ්පාදනය කරනු ලබන බෝග ද්‍රව්‍ය හා පොල් වගාව ආශ්‍රිත නිෂ්පාදන අලෙවි කිරීම මූලික අරමුණු කරගෙන කප්තුරුපාය වෙළඳසැල් ආරම්භ විය. අවම මිල ගණන් මත ඉහළ ගුණාත්මක තත්ත්වයේ පොල් වගාව ආශ්‍රිත නිෂ්පාදන අලෙවි කිරීම කප්තුරුපාය අලෙවිසැල් තුළ සිදු කරයි.

## 2.1.12 නිලධාරී නිල නිවාස ව්‍යාපෘතිය

**වගු අංක 2.11. නිලධාරී නිල නිවාසවල තොරතුරු - 2023**

| අනු අංකය | නිලධාරී නිල නිවාසය | ලිපිනය |
|---|---|---|
| 01 | පාසිකුඩා නිලධාරී නිල නිවාසය | පාසිකුඩා ආදර්ශ පොල් උයන, පාසිකුඩා, කල්කුඩා |
| 02 | පලෙයි නිලධාරී නිල නිවාසය | පලෙයි ආදර්ශ පොල් උයන,<br>නුවර පාර, පලෙයි |
| 03 | බෝපිටිය නිලධාරී නිල නිවාසය | බෝපිටිය ආදර්ශ පොල් උයන, කු/බෝපිටිය |
| 04 | කොහොඹාන නිලධාරී නිල නිවාසය | කොහොඹාන ආදර්ශ පොල් උයන, ගොනාගොල්ල, කොහොඹාන |
| 05 | හඳපානාගල නිලධාරී නිල නිවාසය | හඳපානාගල පොල් පැළ තවාන, හඳපානාගල, වෙහෙරයාය |
| 06 | කටුකැලියාව නිලධාරී නිල නිවාසය | මහිලා මාවත, කටුකැලියාව, අනුරාධපුරය |
| 07 | කතරගම නිලධාරී නිල නිවාසය | කොකෝවිලා සංචාරක නිවාසය,<br>පොල් වගාකිරීමේ මණ්ඩලය, ඩිපෝව පාර, කතරගම |
| 08 | කුඹුරුපිඩ්ඩි නිලධාරී නිල නිවාසය | කුඹුරුපිඩ්ඩි පොල් පැළ තවාන, කුඹුරුපිඩ්ඩි, ත්‍රිකුණාමලය |
| 09 | පුලතිසි කොකෝවිලා | නිලධාරී නිල නිවාසය, පොල් වගාකිරීමේ මණ්ඩලය,<br>කලහගල පාර, නව නගරය, පොළොන්නරුව |

## 2.2 පොල් වගාකිරීමේ මණ්ඩලයේ තවාන් සංවර්ධන වැඩසටහන

### 2.2.1. පොල් පැළ නිෂ්පාදන සහ පැළ නිකුත් කිරීමේ වැඩසටහන

දිවයිනේ වගාකිරීමට අවශ්‍ය උසස් තත්ත්වයේ පොල් පැළ නිෂ්පාදනයකර වගාකරුවන්ට සැපයීම පොල් වගාකිරීමේ මණ්ඩලයේ ප්‍රධාන කාර්යයන්ගෙන් එකකි. ව්‍යාප්ති හා සංවර්ධන අංශයේ සැලසුම්වලට අනුව වර්ෂයේ පැළ නිෂ්පාදනයට අවශ්‍ය බීජ පොල්, තවාන් වෙත සැපයීම, සැලසුම් කිරීම, මෙහෙයවීම හා සම්බන්ධීකරණය, පැළ නිෂ්පාදනය ආදර්ශ පොල් උයන් හා තවාන් සංවර්ධන අංශය මගින් සිදුකෙරේ. පොල් පැළ නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා ප්‍රාදේශීය කාර්යාල, තවාන්, ආදර්ශ පොල් උයන් හා මීගමුව බීජ පොල් ඒකකය ප්‍රධාන වශයෙන් දායක වේ.

ප්‍රාදේශීය කළමනාකරුවන්ගේ මඟපෙන්වීම හා නේවාසික තවාන්භාර නිලධාරීන්ගේ සෘජු අධීක්ෂණය යටතේ පොල් පැළ නිෂ්පාදනය ප්‍රධාන කාර්යය කරගත් පොල් පැළ තවාන් 36ක් මගින් සහ ආදර්ශ පොල් උයන්භාර කළමනාකරුවන්ගේ සෘජු අධීක්ෂණය හා මඟපෙන්වීම යටතේ ආදර්ශ පොල් උයන් 12ක් තුළ ස්ථාපිත පොල් පැළ තවාන් මගින් වගාකරුවන්ට අවශ්‍ය උසස් තත්ත්වයේ ගුණාත්මක පොල් පැළ නිෂ්පාදනය කෙරේ.

පොල් වගාකිරීමේ මණ්ඩලයට අයත් තවාන් සහ ආදර්ශ පොල් උයන් සඳහා අවශ්‍ය උසස් ගුණාත්මයෙන් යුතු බීජ පොල් සපයන ප්‍රධාන කේන්ද්‍රස්ථානය ලෙස මීගමුව බීජ පොල් ඒකකය ක්‍රියා කරයි.

පොල් වගාකරුවන් සඳහා අවශ්‍ය වන උසස් ගුණාත්මයෙන් යුතු පොල් පැළ කාර්යක්ෂමව සැපයීමේ අරමුණින් මණ්ඩලයට අයත් පොල් පැළ තවාන් දිවයින පුරා ස්ථාපිතකර ඇති අතර, ඉන් වැඩි ප්‍රමාණයක් පොල් වගාව වඩාත් ප්‍රචලිතව පවතින වයඹ පළාත තුළ පවතී. ප්‍රාදේශීය පොල් පැළ තවාන්වල කටයුතු ඒ ඒ ප්‍රාදේශීය කාර්යාල මගින් පාලනය හා නඩත්තුව සිදුකරනු ලබයි.

#### 2.2.1.1. පොල් පැළ ඉලක්කයන්

2023 වර්ෂයට අදාළව පොල් වගාකිරීමේ මණ්ඩලය මගින් පොල් පැළ මිලියන 03ක් නිෂ්පාදනය කිරීමට සැලසුම් කළ අතර, ඒ අනුව 2023 වර්ෂයට අවශ්‍ය පොල් පැළ ප්‍රමාණය නිෂ්පාදනය කිරීම සඳහා මණ්ඩලයේ තවාන් හා ආදර්ශ පොල් උයන් වෙත, සපයා ඇති සමස්ත බීජ පොල් ප්‍රමාණය 1,207,348 කි.

මෙයින්, මණ්ඩලීය තවාන් සඳහා බීජ පොල් 1,166,680ක ප්‍රමාණයක් ද, ආදර්ශ පොල් උයන් සඳහා 31,168ක ප්‍රමාණයක් ද, ප්‍රජා තවාන් සඳහා බීජ පොල් 6,000ක ප්‍රමාණයක් ද, හදබිම අධිකාරිය සඳහා බීජ පොල් 3,500ක ප්‍රමාණයක් ද සපයා ඇත.

### 2.2.2 විශේෂිත වැඩසටහන්

01. දියදොර හා හෙට්ටිපොල තවාන්වල මී මැසි ජනපද පවත්වාගෙන යනු ලබයි.

02. පල්ලෙකැලේ පොල් පැළ තවාන :-

I. නිල නිවාසවල ගෙවතු වගා සංවර්ධනය කිරීම.
II. කාබනික පොහොර නිෂ්පාදනයට කොම්පෝස්ට් ටොන් 20ක් නිෂ්පාදනය කිරීම.
III. 2023 -2024 වසර 02 සඳහා ඇඹුන් කෙසෙල් වගාවට GAP සහතිකය ලබාගැනීම.

IV. මී මැසි පාලන ඒකක 05ක් පිහිටුවීම.
V. තවාන් වෙක්රෝල් සේවක සුභසාධක හා සකසුරුවම් සමිතිය යාවත්කාලීනකර අරමුදල් සම්පාදනය හා වාර්ෂික සේවක ඇගයීම සිදුකිරීම.

## 2.2.3. කාබනික පොහොර නිෂ්පාදනය

බඳුන් පොල් පැළ නිෂ්පාදනයේදී බඳුන් මාධ්‍ය, පවතින වගාවන් වලට කාබනික පොහොර ලබාගැනීමට සහ රසායනික පොහොර සඳහා වැයවන මුදල අවම කරගැනීමේ අරමුණින් තවාන තුළ තිබෙන අමුද්‍රව්‍ය උපයෝගී කරගනිමින් තවාන් 36 තුළම කොම්පොස්ට් පොහොර නිෂ්පාදනය ආරම්භ කරන ලදී.

## 2.2.4 අලුත්වැඩියා කටයුතු

01. දියදොර තවානේ වැට හා තවාන්භාර නිලධරී නිල නිවාසයට අයත් වැසිකිළි වල අලුත්වැඩියා කිරීම.
02. හෙට්ටිපොළ තවානේ ඉදිරිපස වැට ගලවා ඉවත්කර අලුතින් ඉදිකිරීම.
03. බිංගිරිය තවානේ වැට අලුත්වැඩියා කිරීම.
04. වෙන්නොරුව තවානේ කැඩී තිබූ වැවෙහි පිටවාන හා ගරාජයේ වහලය අලුත්වැඩියා කිරීම.
05. පොල්ගහවෙල තවානේ විදුලි වැට ඉදිකිරීම හා RX – 2267 දරන ටේලරය අලුත්වැඩියා කිරීම.
06. පල්ලෙකැලේ තවාන සඳහා කාර්යාලය හා මුර සේවක නිල නිවාස 02 සඳහා පානීය ජල පහසුකම් 03ක් ලබාගැනීම, අක්කරයක භූමි කොටසකට විසිරුම් ජල සම්පාදන පද්ධතියක් සකස් කිරීම.
07. ඇඹිලිපිටිය තවානේ විසිරුම් ජල සම්පාදන පද්ධතිය ඉදිකිරීම් කටයුතු අවසන් කිරීම, තහඩු ගබඩාවේ වහලය සෑදීම හා කාර්යාලය කාපට් දමා මේස රෙදි දමා තීන්ත ආලේප කිරීම.
08. කිරිඳිවැල තවානේ විසිරුම් ජල සම්පාදන පද්ධතිය සැකසීම, නිල නිවාසයේ නාන කාමරය සඳහා ටයිල් ඇතිරීම හා කාර්යාල වැසිකිළිය ටයිල් ඇතිරීම.
09. එරම්ණිගොල්ල තවානේ කොන්ක්‍රීට් කණු හා කම්බි දමා වැට සැකසීම හා තවානේ ගරාජය තහඩු දමා අලුත්වැඩියා කිරීම.
10. උහන තවානේ අත් ට්‍රැක්ටරය අලුත්වැඩියා කිරීම, ආරක්ෂිත වැට අලුත්වැඩියා කිරීම, විසිරුම් ජල සම්පාදන පද්ධතිය ඉදිකිරීම හා ජල සම්පාදන පද්ධතිය අලුත්වැඩියා කිරීම.
11. කුඹුරුප්පිඩි තවාන සඳහා විසිරුම් ජල සම්පාදන පද්ධතියක් ඉදිකිරීම.
12. කොරොස්දුව තවානේ තවාන්භාර නිල නිවසේ සිවිලිම අලුත්වැඩියා කිරීම, අක්කරයක භූමි කොටසකට විසිරුම් ජල සම්පාදන පද්ධතියක් ඉදිකිරීම හා අත්ට්‍රැක්ටරයේ එන්ජිම හා කුඩුව අලුත්වැඩියා කිරීම.

## 2.2.5. පුහුණු වැඩසටහන් පැවැත්වීම

01. දියදොර පොල් පැළ තවාන මගින් කුලියාපිටිය කාර්මික විද්‍යාලයේ කෘෂිකර්ම නිෂ්පාදන තාක්ෂණය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව හදාරන සිසුවිය සඳහා තවානේ ක්ෂේත්‍ර පුහුණුව හා කාර්යාලයේ ලිපිලේඛන පිළිබඳ පුහුණුවක් සිදුකිරීම.
02. වැලිපිටිය පොල් පැළ තවාන මගින් ඌව වෙල්ලස්ස විශ්ව විද්‍යාලයේ කෘෂි විද්‍යා පළමු වසර සිසුවියන් වෙනුවෙන් පුහුණු වැඩසටහනක් සිදුකිරීම.
03. පල්ලෙකැලේ පොල් පැළ තවාන මගින් කුණ්ඩසාලේ කෘෂිකර්ම විද්‍යාලයේ පුහුණු අභ්‍යාසලාභීන් 100 දෙනෙකු සඳහා පොල් වගා තාක්ෂණික එක් දින පුහුණුවක් පැවැත්වීම.
04. ඇඹිලිපිටිය පොල් පැළ තවාන මගින් පොල් සංවර්ධන නිලධාරී කොට්ඨාසයේ සහ තිඹොල්කැටිය කොට්ඨාස එක්ව බහුවිධ ප්‍රවේශ වැඩසටහන පැවැත්වීම.

## 3.0 පරිපාලන හා මානව සම්පත් කළමනාකරණ අංශය

2023 වර්ෂය තුළදී ඒ.වී.කේ. මාධවී හේරත් මහත්මිය පොල් වගාකිරීමේ මණ්ඩලයේ සභාපති ලෙස කටයුතු කරන ලදී. මෙම වර්ෂය තුළදී අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීම් 12ක් පවත්වා ඇත.

2023.07.06 දින සිට මේ දක්වා ඩබ්.එම්.ඒ.බී.විජේසිංහ මහතා සාමාන්‍යාධිකාරී තනතුරේ කටයුතු කරනු ලැබේ.

### 3.1 කාර්ය මණ්ඩල ව්‍යුහය

2023 වර්ෂය තුළදී මණ්ඩලයේ ඉලක්ක සපුරා ගැනීම සඳහා පහත සඳහන් කාර්ය මණ්ඩලය දායක වී ඇත.

**වගු අංක 3.1 කාර්ය මණ්ඩල ව්‍යුහය**

| | |
|---|---|
| ජ්‍යෙෂ්ඨ කළමනාකාර | 02 |
| කළමනාකාර | 36 |
| කනිෂ්ඨ කළමනාකාර | 37 |
| ක්‍රියාත්මක කිරීමේ/ උපදේශන සේවා | 00 |
| කළමනාකරණ සහකාර (තාක්ෂණ) | 224 |
| කළමනාකරණ සහකාර (තාක්ෂණ නොවන) | 233 |
| ප්‍රාථමික ශ්‍රේණිය(ශිල්පීය) | 36 |
| ප්‍රාථමික ශ්‍රේණිය(අර්ධ ශිල්පීය) | 01 |
| ප්‍රාථමික ශ්‍රේණිය(ශිල්පීය නොවන) | 65 |
| දැනට තනතුරු දරන්නාට පමණක් පෞද්ගලික වන සේ පවතින තනතුරු | 01 |
| වතුපාලන සේවයේ සේවකයින් (ස්ථිර ) | 90 |
| එකතුව | 725 |

### 3.2 බඳවා ගැනීම් හා උසස්වීම්

2023 වර්ෂය තුළදී අභ්‍යන්තර විගණන නිලධාරී තනතුර සඳහා නව බඳවා ගැනීමක් ද සාමාන්‍යාධිකාරී, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ව්‍යා. හා සං.), ගණකාධිකාරී (මූල්‍ය) ගණකාධිකාරී (ආ.පො.උ.), සහ විෂයානුබද්ධ විශේෂඥ (බෝග සංරක්ෂණ) යන තනතුරු සඳහා නිලධාරීන් උසස්වීම් ද ලබා ඇත.

### 3.3 දේශීය සහ විදේශීය පුහුණු වැඩසටහන්

2022 වර්ෂයේදී මණ්ඩලයේ විවිධ අංශ වල සේවයේ නියුතු නිලධාරීන්ගේ දැනුම, ආකල්ප, කුසලතා වර්ධනය කිරීමේ අරමුණින් දේශීය වශයෙන් පවත්වන ලද විවිධ සම්මන්ත්‍රණ, වැඩමුළු, පුහුණු සහ උපාධි පාඨමාලා සඳහා 189 දෙනෙකු බාහිර ආයතන වෙත යොමුකර පුහුණු අවස්ථා සලසා දී ඇති අතර, මණ්ඩලයේ අනුග්‍රහය යටතේ විවිධ සම්පත් දායකත්වයන් තුළින් පොල් සංවර්ධන පුහුණු මධ්‍යස්ථානය සමඟ එක්ව නිලධාරීන් 160ක් දේශීය පුහුණු පාඨමාලා/ වැඩමුළු/ සම්මන්ත්‍රණ සඳහා යොමුකර ඇත.

වගු අංක 3.2. සාමූහික දේශීය පුහුණු සැසිවාරයන්

| සාමූහික දේශීය පුහුණු සැසිවාරයන් | පුහුණුලාභීන් සංඛ්‍යාව |
|---|---|
| අක්ෂර වින්‍යාසය පුහුණුව | 57 |
| ආතති කළමනාකරණය | 100 |
| බැංකු සැසඳුම් පොල් සංවර්ධන පුහුණු මධ්‍යස්ථානයේ පැවැත්වීම | 37 |
| HRM Conference | 07 |
| වියදම් හා ගෙවීම් පටිපාටිය හා මුදල් රෙගුලාසි පිළිබඳ පාඨමාලාව | 05 |
| නව බදු නීතිය හා ආදායම් බදු වගකීම් ගණනය කිරීම | 04 |
| Advanced Excel පොල් සංවර්ධන පුහුණු මධ්‍යස්ථානයේ පැවැත්වීම | 43 |
| හානි පාඩු හා මු.රෙ.104 යටතේ වූ පරීක්ෂණ පිළිබඳ පාඨමාලාව | 02 |
| වැඩ-ජීවන සමතුලිතභාවය | 80 |
| එකතුව | 335 |

### 3.4 මානව සම්පත් කළමනාකරණ පද්ධතිය ස්ථාපනය

මානව සම්පත් කළමනාකරණ පද්ධතිය සම්පූර්ණකර මේ වන විට එය ක්‍රියාත්මක මට්ටමේ පවතී.

### 3.5 කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ

මණ්ඩලයේ 2023 වර්ෂයේදී නිලධාරීන් 184 දෙනෙකු සඳහා කාර්යක්ෂමතා කඩයිම් පරීක්ෂණ පවත්වා අවසන් කරගැනීමට හැකි විය.

### 3.6 විශ්‍රාම ලබාගැනීම්

මණ්ඩලයේ අභිවෘද්ධිය සඳහා තම හැකියාවන් හා දක්ෂතාවයන් කැපකරමින් කාර්යක්ෂමව මනා සේවාවක් ඉටුකර වයස සම්පූර්ණ වීම නිසා නිලධාරීන්/සේවකයින් 08 දෙනෙකු මණ්ඩලයේ සේවයෙන් විශ්‍රාම ලබා ඇත. මෙම නිලධාරීන්/ සේවකයන් හට හිමිවිය යුතු පාරිතෝෂික සහ අනෙකුත් ප්‍රතිලාභයන් නියමිත කාලයන් තුළදී නොපමාව ඔවුන් වෙත ලබාදීමට පරිපාලන හා මානව සම්පත් කළමනාකරණ අංශය අදාළ පියවර ගන්නා ලදී.

### 3.7 ප්‍රවාහන සංචිතය

වගු අංක 3.3. වාහන සාරාංශය 2023

| | වාහන වර්ගය | සංඛ්‍යාව |
|---|---|---|
| 01 | ලොරි | 17 |
| 02 | ඩබල් කැබ් | 45 |
| 03 | ට්‍රැක්ටර් රෝද 02 | 26 |
| 04 | ට්‍රැක්ටර් රෝද 04 | 50 |
| 05 | ට්‍රැක්ටර් ටේලර්ස් | 90 |
| 06 | වෑන් | 1 |
| 07 | බස් | 3 |
| 08 | ජීප් | 4 |
| 09 | කාර් | 6 |
| 10 | ත්‍රී රෝද රථ | 1 |
| 11 | මෝටර් සයිකල් | 60 |
| 12 | බැකෝ ලෝඩර් | 2 |
| එකතුව | | 305 |

### 3.8 ප්‍රසම්පාදන කටයුතු

පොල් වගාකිරීමේ මණ්ඩලය මගින් සිදුකරනු ලබන ව්‍යාප්ති සේවාවන් අඛන්ඩව සිදුකිරීමට මෙන්ම ගුණාත්මකභාවය වැඩිකිරීමට අවශ්‍ය ප්‍රාග්ධන භාණ්ඩ මෙන්ම මුද්‍රිත යෙදවුම් මිලදී ගැනීම, පොල් පැළ නිෂ්පාදනය සඳහා අවශ්‍ය යෙදවුම් මිල දී ගැනීම, ප්‍රධාන කාර්යාලය හා අනෙකුත් ප්‍රාදේශීය කාර්යාල, ආදර්ශ පොල් උයන් හා තවාන් හි සේවය කරනු ලබන නිලධාරීන්ගේ කාර්යක්ෂමතාවය හා ඵලදායීතාවය ඉහළ නැංවීම සඳහා අවශ්‍ය ප්‍රාග්ධන භාණ්ඩ හා සේවාවන් මිලදී ගැනීමට අදාළව 2023 වර්ෂයේ දී රුපියල් මිලියන 113ක ප්‍රසම්පාදන කටයුතු සිදුකර ඇත.

### 3.9 ඉදිකිරීම් හා අත්පත්කර ගැනීම්

මණ්ඩලීය ප්‍රාග්ධන වත්කම් අත්පත්කර ගැනීම හා ප්‍රාග්ධන වත්කම්වල නඩත්තු කටයුතු මේ යටතේ ආවරණය කෙරේ. ඒ අනුව, පහත දැක්වෙන පරිදි ඉදිකිරිම් හා අලුත්වැඩියා කටයුතු 2023 වර්ෂයේ දී සිදුකිරීමට හැකි විය.

වගු අංක 3.4. 2023 වර්ෂයේ සිදුකළ ඉදිකිරීම් හා අත්පත්කර ගැනීම්

| ප්‍රාදේශීය කාර්යාලය | අනු අංක | අලුත්වැඩියාව |
|---|---|---|
| ගාල්ල | 01 | මයිටා විද්‍යාගාරයට යාබද වැසිකිළිය නවීකරණය. |
| | 02 | ප්‍රාදේශීය කාර්යාලයේ ප්‍රධාන දොර ජනෙල් අලුත්වැඩියාව. |
| | 03 | අම්බලන්ගොඩ පොල් සංවර්ධන නිලධාරී නිල නිවාසයේ වහල අලුත්වැඩියාව. |
| | 04 | කාර්යාලයේ ප්‍රධාන ගොඩනැගිල්ලේ වහල අලුත්වැඩියාව. |
| | 05 | කාර්යාලයේ විධායක නිලධාරී කාමර 03ක් (Partition) වෙන් කිරීම. |
| | 06 | අංක 01 නිල නිවාසයේ වහල අලුත්වැඩියාව. |
| මීගමුව | 07 | පැරණි ගොඩනැගිල්ල අලුත්වැඩියාව. |
| කළුතර | 08 | කෑම කාමරයේ වහලය අලුත්වැඩියාව. |
| | 09 | ප්‍රාදේශීය කාර්යාලයේ සම්පූර්ණ තාප්පය අලුත්වැඩියාව. |
| අම්පාර | 10 | ප්‍රාදේශීය කාර්යාලයේ අභ්‍යන්තර සිවිලිම අලුත්වැඩියාව. |
| | 11 | ප්‍රාදේශීය කාර්යාලයේ ගොඩනැගිල්ලේ වහලය අලුත්වැඩියාව. |
| | 12 | ප්‍රාදේශීය කාර්යාලයේ ගොඩනැගිල්ලේ වතුර ටැංකිය අලුත්වැඩියාව. |
| රත්නපුර | 13 | කළමනාකරු නිල නිවසේ නාන කාමරය අලුත්වැඩියාව. |
| මඩකලපුව | 14 | බටහිර දිශාවේ වහලය දීර්ඝ කිරීම. |
| මාරවිල | 15 | බත්තුළුඔය පො.ස.නි.නිවාස භූමියේ වැට අලුත්වැඩියාව. |
| | 16 | බත්තුළුඔය පො.ස.නි.නිවාසයේ කාර්යාලය අලුත්වැඩියාව. |
| | 17 | ආණමඩුව පො.ස.නි.නිවාසයේ වහල අලුත්වැඩියාව. |
| යාපනය | 18 | සිවිලිම අලුත්වැඩියාව. |
| හම්බන්තොට | 19 | ප්‍රාදේශීය කාර්යාලයේ පේමන්ට් හා ඉස්තෝප්පු කොටස අලුත්වැඩියාව. |
| කුළියාපිටිය | 20 | කාර්යාල ගොඩනැගිල්ලේ සිවිලිම අලුත්වැඩියාව. |
| ගම්පහ | 21 | සූරියපාළුව අංක 02 නිල නිවාසයේ වහල අලුත්වැඩියාව. |
| | 22 | කාර්යාල ශ්‍රවණාගාරයේ සිවිලිම අලුත්වැඩියාව. |
| | 23 | ඉදිගොල්ල අංක 08 නිල නිවාසයේ වහල අලුත්වැඩියාව. |
| ප්‍රධාන කාර්යාලය | 24 | ඉදිරිපස වානේ ව්‍යුහමය කොටසේ ඉදිකිරීම් ආරම්භ කිරීම. |

# 4.0 අභ්‍යන්තර විගණනය

## 4.1 අභ්‍යන්තර විගණනයේ අරමුණ

අවදානම් නිවැරදිව හඳුනාගෙන කාර්යය සාධනය වැඩි දියුණු කිරීම සඳහා නිවැරදි අභ්‍යන්තර පාලන ක්‍රම ක්‍රියාත්මක කිරීමට පොල් වගාකිරීමේ මණ්ඩලයේ කළමනාකාරීත්වයට ඉඩ සැලසීම.

## 4.2 මෙම වර්ෂය තුළ සිදුකරන ලද අභ්‍යන්තර විගණන පරීක්ෂණ

අභ්‍යන්තර විගණන විෂය පථයට අදාළ කාර්යභාරය හා රාජකාරී ඉතාමත් ගුණාත්මක තත්ත්වයකින් අඛණ්ඩ පදනමක් මත 2023 වර්ෂය තුළ ඉටුකර ඇත.

1. විශේෂ විගණන කටයුතු පිළිබඳ සංක්ෂිප්ත වාර්තාව - මහයාය ආදර්ශ පොල් උයන
2. විශේෂ විගණන කටයුතු පිළිබඳ සංක්ෂිප්ත වාර්තාව - පල්ලේකැලේ පොල් පැළ තවාන
3. කළුතර ප්‍රාදේශීය කාර්යාලය - සහන ගෙවීම් අතුරු පරීක්ෂණ වාර්තාව
4. ප්‍රධාන කාර්යාලයට අදාළ රථ වාහනවල ඉන්ධන පාරිභෝජනය ආශ්‍රිත විගණන පරීක්ෂණය
5. වාර්ෂික විගණන කටයුතු පිළිබඳ සංක්ෂිප්ත වාර්තාව - රන්දෙණිය ආදර්ශ පොල් උයන
6. පොල් වගාකිරීමේ මණ්ඩලයට අයත් තවාන්වලට අදාළව වෙන් වෙන් වශයෙන් ලාභ/ අලාභ ගණනය කිරීම ප්‍රමාද වීම හා දෝෂ සම්බන්ධව වාර්තා කිරීම.
7. ප්‍රධාන කාර්යාලයේ 982 (කප්රුක ණය) ගිණුම බැංකු සැසඳුම් පරීක්ෂාව
8. ප්‍රධාන කාර්යාලයේ ගබඩාව සම්බන්ධව සිදුකරන ලද විගණන පරීක්ෂාව
9. අනුරාධපුර නිල නිවාසය ඉදිකිරීමට අදාළ ලිපිගොනුව අස්ථානගත වීම සම්බන්ධ වාර්තාව
10. බෝපිටිය ආදර්ශ පොල් උයන - හදිසි විගණන පරීක්ෂාවේ සංක්ෂිප්ත වාර්තාව
11. මහයාය ආදර්ශ පොල් උයනේ කප්තුරුපාය පරණ තොග ඉවත් කිරීමට අදාළ නිරීක්ෂණ හා නිර්දේශ ඇතුළත් වාර්තාව
12. කන්දෙටිය පොල් පැළ තවාන - හදිසි විගණන පරීක්ෂාව
13. දියදොර පොල් පැළ තවාන - හදිසි විගණන පරීක්ෂාව
14. වාර්ෂික විගණන කටයුතු පිළිබඳ සංක්ෂිප්ත වාර්තාව - මාතලේ ප්‍රාදේශීය කාර්යාලය
15. ගර්ට්ලන්ඩ් උඩුගම බෙදුමේ දැවමය වටිනාකමක් සහිත ගස් 02 ක් කැපීම පිළිබඳ විශේෂ විගණන පරීක්ෂණය
16. පොල් සංවර්ධන නිලධාරී කාර්යාල පරීක්ෂාව - මාතලේ ප්‍රාදේශීය කාර්යාලය
17. කප්රුක ආයෝජන ණය ලිපි ලේඛන පරීක්ෂාව - මාතලේ ප්‍රාදේශීය කාර්යාලය
18. මාතලේ ප්‍රාදේශීය කාර්යාලයේ සිදුවන අක්‍රමිකතා සම්බන්ධ වාර්තාව

19. මහයාය ආදර්ශ පොල් උයනේ තේක්ක ගස් 24 ක් අලෙවි කිරීම සම්බන්ධ විශේෂ විගණන පරීක්ෂණය
20. වටිනා දැව ගස් භෞතික සත්‍යාපනය - මහයාය ආදර්ශ පොල් උයන
21. මහයාය ආදර්ශ පොල් උයනේ පොල් වගාවට අවහිර තේක්ක ගස් 24 ක් අලෙවි කිරීම සම්බන්ධ විශේෂ විගණන පරීක්ෂණය
22. වාර්ෂික විගණන වාර්තාව - කොරෙයි ආදර්ශ පොල් උයන
23. ප්‍රධාන කාර්යාලයේ බැංකු ගිණුම් ආශ්‍රිත විගණන පරීක්ෂාව

ඉහත සඳහන් ඒකකවල සිදුකරන ලද විගණන කටයුතුවලදී අනාවරණය වූ වැරදි හා අඩුපාඩු සභාපතිතුමා වෙත වාර්තාකර ඒවා නිවැරදි කිරීමට අවශ්‍ය පියවරගෙන ඇත. තවද මෙම විගණන නිරීක්ෂණයන් හා පිළිතුරු විගණන හා කළමනාකරණ කමිටුවවටද ඉදිරිපත්කර එම කමිටු නිර්දේශයන් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත අවශ්‍ය තීරණ ගැනීම සඳහා ඉදිරිපත්කර ඇත.

## 4.3 විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම

### 4.3.1 මෙහි අරමුණ

අභ්‍යන්තර හා බාහිර විගණන මගින් හෙළිදරව් වන වැරදි හා අඩුපාඩු නිවැරදි කිරිමට කළමනාකාරීත්වය වෙත මඟපෙන්වීමක් සිදුකිරීම සහ මණ්ඩලයේ අභ්‍යන්තර විගණනය කාර්යක්ෂම හා ශක්තිමත් කිරීම විගණන කමිටු රැස්වීම් පැවැත්වීමේ ප්‍රධාන අරමුණ වේ.

මෙම වර්ෂය තුළ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 04ක් පවත්වා ඇත.

**4.3.2 පැවැත්වූ දිනය**

| | |
|---|---|
| ❖ 2023/01 රැස්වීම | 2023.01.20 |
| ❖ 2023/02 රැස්වීම | 2023.05.10 |
| ❖ 2023/03 රැස්වීම | 2023.10.11 |
| ❖ 2023/04 රැස්වීම | 2023.12.19 |

### 4.3.3 කමිටු සංයුතිය

1. ටී.එම්.ජේ.බණ්ඩාර මහතා — සභාපති
   අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (වැ.බ.)
   රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව

2. කේ.එස්. විජයකීර්ති මහතා — සාමාජික
   අතිරේක ලේකම්
   කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය

3. සමන්ත කුමාර මලවිආරච්චි මහතා — සාමාජික
   අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික

4. කේ.ඒ.සී.ශාමන්ත මහතා — නිරීක්ෂක
   ප්‍රධාන අභ්‍යන්තර විගණක
   කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය

5. කේ.ඩී.ඒ.සී. අමරසේන මිය — නිරීක්ෂක
   විගණන අධිකාරී
   ජාතික විගණන කාර්යාලය

6. ඩබ්.එම්.ඒ.බී විජේසිංහ මහතා — ලේකම්/කැඳවුම්කරු
   සාමාන්‍යාධිකාරී
   පොල් වගාකිරීමේ මණ්ඩලය

7. බී.ඒ.වජිර බමුණුආරච්චි මහතා — අභ්‍යන්තර විගණක
   (පොල් වගාකිරීමේ මණ්ඩලය)

අභ්‍යන්තර විගණන පරීක්ෂණ වලින් හෙළිදරව්වන වැරදි අඩුපාඩු හා රජයේ විගණන අංශයේ විගණන විමසුම් ද විගණන හා කළමනාකරණ කමිටුවේ දී සාකච්ඡාකර අවශ්‍ය නිවැරදි කිරීම් සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කරනු ඇත.

# 05. මූල්‍ය කළමනාකරණ අංශය

## 5.1 ගිණුම් ප්‍රකාශය

පොල් වගාකිරීමේ මණ්ඩලයේ සමස්ත කාර්යයන් 1971 අංක 46 දරන පොල් සංවර්ධන පනතේ විධිවිධානයන්ට අනුකූලව, නියමිත චක්‍රලේඛ මුදල් රෙගුලාසිවලට යටත්ව ශ්‍රී ලංකා රාජ්‍ය මූල්‍ය ගිණුම්කරණ ප්‍රමිති අනුව 2023.12.31 දිනෙන් අවසන් වාර්ෂික මූල්‍ය වාර්තා ඉදිරිපත්කර ඇත.

දීප ව්‍යාප්තව ප්‍රාදේශීය කාර්යාල 20 ක් ද පුහුණු මධ්‍යස්ථාන 03 ක් ද සහිත සම්බන්ධීකරණ ජාලයක් තුළ තවාන් 37 කින් සහ ආදර්ශ පොල් උයන් 12 කින් සපුරාගත යුතු ඉලක්ක සාක්ෂාත්කර ගැනීමට ද ජාතික මට්ටමේ සංවර්ධන ව්‍යාපෘතීන් සහ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට උචිතවන්නා වූ මූල්‍ය ඇස්තමේන්තු සකස් කිරීම, සැලසුම් කිරීම, මෙහෙයවීම හා පාලනය කිරීම, ලේඛනගත කිරීම වාර්තා කිරීම හා පුරෝකථනය කිරීම මූල්‍ය කළමනාකරණ අංශයේ ප්‍රමුඛ ක්‍රියාදාමයයි.

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මූල්‍ය කළමනාකරණ)ගේ මෙහෙයවීම හා මහපෙන්වීම යටතේ මූල්‍ය කළමනාකරණ අංශයේ සහකාර සාමාන්‍යාධිකාරී (මූල්‍ය කළමනාකරණ), ගණකාධිකාරී (මූල්‍ය), ගණකාධිකාරී (ආදර්ශ පොල් උයන්), ගිණුම් නිලධාරීන් වශයෙන් හා සහායක කාර්යය මණ්ඩලය දීප ව්‍යාප්තව ප්‍රාදේශීය කාර්යාල තුළ මූල්‍ය කටයුතු මෙහෙයවීම, වාර්තා කිරීම හා පාලනය කිරීම සිදු කරනු ලබයි.

2023 වර්ෂයේ මණ්ඩලයේ ඇස්තමේන්තුවලට අදාළව පුනරාවර්තන වැය ශීර්ෂය යටතේ රු.මි. 509.793 ක් සහ ප්‍රාග්ධන වැය ශීර්ෂය යටතේ රු.මි. 500 ක් මහා භාණ්ඩාගාරය මගින් ප්‍රතිපාදන ලබාදී ඇත.

කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය වෙනුවෙන් පොල් වගාව නගාසිටුවීම සඳහා 2023 වර්ෂයේදී පහත සඳහන් විශේෂ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට ද පොල් වගාකිරීමේ මණ්ඩලය කටයුතුකර ඇත.

2023 වර්ෂයේදී ගාල්ල, මාතර හා හම්බන්තොට දිස්ත්‍රික්කයන් තුළ පැතිර ඇති වැලිගම පොල් කොළ මැළවීමේ හා කුණුවීමේ රෝග මර්දන ව්‍යාපෘතිය සඳහා රු.මි. 25.654 ක් ද, සුදු මැස්සා කෘමි උවදුර පාලනය කිරීම වෙනුවෙන් රු.මි.85.5 ක් ද,බ්‍රොන්ටිස්පා කෘමි උවදුර පාලනය කිරීම වෙනුවෙන් රු.මි.9.7 ක් ද කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශ ප්‍රතිපාදන යටතේ ලබා දී ඇත.

එසේම, 2023 වර්ෂයේදී අලුතින් ආරම්භ කරන ලද උතුරු පොල් ත්‍රිකෝණ ව්‍යාපෘතියේ පොල් පැළ සඳහා ප්‍රවාහනය වෙනුවෙන් රු.මි. 9.5ක් කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය විසින් ද රු.මි. 3.406ක් පොල් සංවර්ධන අධිකාරිය විසින් ද අප වෙත ලබා දී ඇත.

ස්වයං මූල්‍ය ඒකකය යටතේ 2023.12.31 දිනට තවාන් සංවර්ධන අංශය රු.මි. 144.72 ක ඌණතාවයක් ද ආදර්ශ පොල් උයන් මගින් රු.මි. 20.39 ක අතිරික්තයක් ද උපයා ඇත. පොල් වගාකිරීමේ මණ්ඩලයේ 2022 වර්ෂය තුළ සමස්ත මෙහෙයුම්වලට අදාළව රු.මි. 18.80ක විවිධ අදායමක් උපයා ගැනීමට හැකි වී තිබේ. එසේම 2023.12.31 දිනට සමස්ත ඌණතාවය රු.මි. 62.743 කි.

2023 වර්ෂය තුළ දරන ලද පුනරාවර්තන වියදම රු.මි. 634.944 ක් වූ අතර, පොල් ක්ෂේත්‍රයේ ව්‍යාප්ති හා සංවර්ධන සේවාව වෙනුවෙන් පොල් වගාකරුවන්ට සංවර්ධන වැඩසටහන් හා සහනාධාර ලෙස රු.මි. 586.485 ක් වැය කොට ඇත. ඒ අනුව මණ්ඩලය සතු වත්කම්වල සමස්ත වටිනාකම රු.බි. 5.281 කි.

පොල් වගාකිරීමේ මණ්ඩලය
9/428, ඩෙන්සිල් කොබ්බැකඩුව මාවත,
බත්තරමුල්ල.

**Coconut Cultivation Board**
**Statement of Financial Position for the Year Ended as at 31st December 2023**

| | Note | Budget 2023 Rs. | 2023 Rs. | 2023 Rs. | 2022 Rs. | 2022 Rs. |
|---|---|---|---|---|---|---|
| **ASSETS** | | | | | | |
| **Non- Current Assets** | | | | | | |
| Property, Plant and Equipment | 02 | 236,249,509 | 2,631,365,539 | | 2,685,637,453 | |
| Work In Progress | 03 | | 37,184,910 | | 52,785,916 | |
| Kapruka Refinance Investment (L | 04 | | 560,716,597 | | 431,238,846 | |
| Biological Assets | 05-01 | | 617,432,939 | | 581,992,301 | |
| Biological Stock | 06 | | 102,277,100 | 3,948,977,086 | 44,188,215 | 3,795,842,731 |
| Leased Land | 07 | | 4,732,920 | 4,732,920 | 4,879,769 | 4,879,769 |
| **Current Assets** | | | | | | |
| Inventories / Stocks | 08 | | 514,593,147 | | 902,523,566 | |
| Trade and other Receivables | 09 | | 172,391,881 | | 534,370,911 | |
| Prepayments | 10 | | 858,620 | | 536,164 | |
| Deposits (ST) | 11 | | 4,418,507 | | 4,168,507 | |
| Investment (ST) | 12 | | 904,068,523 | | 713,680,908 | |
| Cash and Cash Equivalents | 13 | | 217,409,510 | | 254,762,252 | |
| | | | | 1,813,740,188 | | 2,410,042,308 |
| **Total Assets** | | | | 5,767,450,193 | | 6,210,764,808 |
| **LESS: LIABILITIES** | | | | | | |
| **Current Liabilities** | | | | | | |
| Payable | 14 | | 202,090,026 | | 169,140,827 | |
| Accrued Expenses | 15 | | 26,007,058 | | 19,406,048 | |
| Short -term Provision | 16 | | 21,193,131 | | 35,516,580 | |
| | | | 249,290,215 | | 224,063,455 | |
| **Non-current liabilities** | | | | | | |
| Long Term Provision | 16 | | 237,140,792 | | 239,903,342 | |
| | | | 237,140,792 | | 239,903,342 | |
| **Total liabilities** | | | | 486,431,007 | | 463,966,797 |
| **Total Net Assets** | | | | 5,281,019,186 | | 5,746,798,011 |
| **NET ASSETS/EQUITY** | | | | | | |
| **Accumulated Fund** | | | | | | |
| General Fund | 18 | | 1,613,421,665 | | 1,983,402,596 | |
| Capital Fund | 17 | | 393,493,356 | | 359,228,377 | |
| Capital Fund(Kapruka) | 19 | | 1,099,584,403 | | 972,228,691 | |
| Cr. Grant. Fund (Kapruka) | 20 | | 193,106,945 | 3,299,606,368 | 185,333,917 | 3,500,193,581 |
| **Reserves** | | | | | | |
| Revaluation Reserve | 21 | | 13,866,117 | | 66,937,441 | |
| Asset Revaluation Reserve | 21 | | 1,798,827,780 | | 2,006,425,351 | |
| Revenue Reserves (C.M.G) | 22 | | 168,718,923 | 1,981,412,819 | 173,241,637 | 2,246,604,429 |
| **Total Net Assets /Equity** | | | | 5,281,019,186 | | 5,746,798,010 |

The Accounting Policies and Notes on Page Nos. 1 to 56 are integral part of these Financial Statements.The board of Directors is responsible for the preparation and presantation of these Financial Statements.

G.D.T.S. Perera
Deputy General Manager
Finance Management
Coconut Cultivation Board

G. D. T. S. Perera
Deputy General Manager (Acting)
(Finance Management)
Coconut Cultivation Board
9/428, Denzil Kobbekaduwa Road
Battaramulla.

W.M.A.B. Wijesinghe
General Manageer
Coconut Cultivation Board

W. M. A. B. Wijesinghe
General Manager
Coconut Cultivation Board
9/428, Denzil Kobbekaduwa Mawatha
Battaramulla

A.V.K. Madhavi Herath
Chairman
Coconut Cultivation Board

A. V. K. Madhavie Herath
Chairman
Coconut Cultivation Board
9/428, Denzil Kobbekaduwa Mawatha
Battaramulla.

K.S. Wijayakeerthi
Additional Secretary - Ministry of Plantation
Board of Director
Coconut Cultivation Board

K. S. Wijayakeerthi
Additional Secretary
(Minor Crops Development)
Ministry of Plantation Industries
3rd Floor, Sethsiripaya Stage II,
Battaramulla

**Coconut Cultivation Board**
**Statement of Financial Performance for the Year Ended**
**31 st DECEMBER 2023**

| | Note | Approved Budget 2023 | 2023 | 2023 | 2022 | 2022 |
|---|---|---|---|---|---|---|
| | | Rs. | Rs. | Rs. | Rs. | Rs. |
| Operating Revenue | | | | | | |
| Government Recurrent Grant | | 510,000,000 | 509,793,000 | | 394,520,000 | |
| Government Capital Grant | | 500,000,000 | 465,735,021 | | 228,000,000 | |
| Ministry of Plantation Industries - Weligama Wilt | | | 26,119,900 | | 45,126,000 | |
| Ministry of Plantation Industries - Brontispa Insects | | | 9,700,000 | | - | |
| Ministry Special Project | | | - | | 48,888,000 | |
| Ministry of Plantation - White Fly | | | 85,500,000 | | - | |
| Ministry of Plantation - Intercrop Subsidy | | | - | | 30,000,000 | |
| Ministry of Plantation Industries - Irrigation Project | | | - | | 31,500,000 | |
| Ministry of Plantation Industries - North Coconut Tran: | | | 3,406,386 | | - | |
| Ministry of Plantation Industries - North Prov: Seeding PR | | | 9,500,000 | | - | |
| Min. of Plts - Impr. of coconut land Prod. Prject | | | - | | 62,910,000 | |
| Total of Revenue (A) | | | | **1,109,754,307** | | **840,944,000** |
| Other Income | | | - | | | |
| Sundry Income | 24 | 7,990,000 | 18,804,016 | | 53,412,252 | |
| Coconut Model Garden Income (i) | 26 | 711,555,708 | 377,370,876 | | 553,143,470 | |
| Kapruka Project(i) | 29 | - | 180,909,255 | | 111,574,029 | |
| Profit on disposal account | 25 | - | - | | 61,652 | |
| Circuit Bungalow Income (cmg) | 26 | 11,522,000 | 3,030,205 | | 1,555,470 | |
| Circuit Bungalow Income | 30 | | 4,365,600 | | 4,295,849 | |
| Mita Project Income | 31 | 24,000,000 | 16,674,386 | | 10,962,875 | |
| Nursery Income | 23 | 1,890,584,720 | 815,232,594 | | 994,486,983 | |
| Training Center Income | 28-2 | 3,810,000 | 298,176 | 1,416,685,109 | 62,264 | 1,729,554,843 |
| | | | | **2,526,439,416** | | **2,570,498,843** |
| Development Programme Expenses | 27 | 500,000,000 | | **472,040,263** | | **453,373,552** |
| Special Projects | 27-1 | | | **114,444,834** | | - |
| Operating Expenditure | | | | | | |
| Personal Emoluments | 28 | 510,000,000 | 456,066,871 | | 396,829,213 | |
| Travelling & Subsistense | 28 | 7,134,148 | 5,478,300 | | 5,365,044 | |
| Supplies And Consumable Used | 28 | 44,815,439 | 28,680,680 | | 33,657,730 | |
| Maintatinance | 28 | 65,467,715 | 17,183,133 | | 43,659,110 | |
| Contractual Servicess | 28 | 37,710,900 | 32,428,326 | | 25,357,012 | |
| Depreciation And Amortization Expenses | 28 | - | 82,647,065 | | 55,517,342 | |
| Other Recurrent Expenditure | 28 | 62,409,350 | 10,726,973 | | 53,800,340 | |
| Coconut Model Garden Expense | 26 | 543,823,757 | 356,068,717 | | 333,416,808 | |
| Nursery Expense | 23 | 1,646,380,603 | 959,949,795 | | 729,007,963 | |
| Circuit Bungalow Expense | 30 | 7,882,160 | 3,767,955 | | 1,784,829 | |
| Circuit Bungalow Expense (cmg) | 26 | | 3,938,194 | | 1,764,857 | |
| Mita Project Expense | 31 | 22,661,805 | 15,973,911 | | 13,324,134 | |
| Kapruka Ayojana Fund Expenditure | 29 | - | 28,054,451 | | 18,622,731 | |
| Training Center Expenses | 28-2 | 17,949,003 | 1,733,376 | | 15,395,760 | |
| Total Expenses | | | | **2,002,697,748** | | **1,727,502,874** |
| Surplus/Deficiate for the year | | | - | **(62,743,429)** | | **389,622,417** |

**Coconut Cultivation Board**

**CONSOLIDATED CASH FLOW STATEMENT FOR THE YEAR ENDED 31 st DECEMBER 2023**

| Note | | 2023 Rs | | 2022 Rs |
|---|---|---|---|---|
| Cash Flows from Operating Activities | | | | |
| Surplus /(deficit) from ordinary activities | | (62,743,429) | | 389,622,417 |
| Adjustment for Item not Involving Movement of Cash | | | | |
| Depreciation of the Year | 112,845,225 | | 55,543,182 | |
| Provision for Gratuity | 29,360,246 | | 18,739,587 | |
| Revaluation of Assets | (260,668,896) | | | |
| Provision for Audit Fees | 450,000 | | - | |
| Revenue reserve | (4,522,715) | | | |
| Interest Income | (10,391,409) | | (7,691,157) | |
| Mature Plantation Depreciation of the year | 37,045,340 | | 11,069,788 | |
| Write-off Lease Land | 146,849 | | 146,849 | |
| Write-off Capital Depreciation of the Year | 34,264,978 | | (39,399,282) | |
| Provision for cash handling allowane | 1,710,000 | | 1,600,000 | |
| Provition for Bulding Contract | (14,485,699) | | | |
| Provision for L.R.C. Tax | 275,000 | (73,971,081) | 275,000 | 40,283,967 |
| | | (136,714,509) | | 429,906,384 |
| Adjustment - Kapruka Fund | | | | |
| Operational Account Kapruka Surplus (Deficit) Note 30 | | | - | |
| Interest Income | (178,613,097) | | (111,136,279) | |
| Credit Guaranty Fund ( Kapruka ) | 2,948,658 | (175,664,439) | 1,282,018 | (109,854,261) |
| Operating Profit of Working Capital | | (312,378,948) | | 320,052,124 |
| Change in Items of Working Capital | | | | |
| Biological Assets | - | | | |
| Livestocks(increase)/decrease | (58,088,885) | | (10,020,025) | |
| Stocks (Increase) / Decrease | 387,930,419 | | (121,281,977) | |
| Debtors (Increase) / Decrease | 361,979,030 | | (457,523,626) | |
| Deposit (Increase) / Decrease | (250,000) | | (652,250) | |
| Current Account (Increase) / Decrease | | | - | |
| Current Account (Increase) / Decrease | - | | | |
| Current Account (Increase) / Decrease | - | | | |
| Fixed Deposits (Increase) / Decrease - ST | (190,387,615) | | (592,406,942) | |
| Prior year adjustment kapruka | 106,936 | | 38,843 | |
| Prior year adjustment | (189,164,358) | | 10,439,422 | |
| Prepayment ( Increase ) Decrease | (322,456) | | (423,584) | |
| Creditors Increase/ ( Decrease ) | 32,949,199 | | (144,129,273) | |
| Loan -term Provision | - | | | |
| Short -term Provision | - | | | |
| Accrued Expenses Increase / (Decrease) | 6,601,010 | 351,353,280 | (578,355) | (1,316,537,767) |
| Net Cash Generated from Operating Activities | | 38,974,332 | | (996,485,643) |
| Cash Flows from Investing Activities | | | | |
| Purchase of Fixed Assets ( Increase) | (124,891,694) | | (76,080,444) | |
| Asset Adjustment | 29,273,043 | | 256,085 | |
| Mature Planation | 54,482,818 | | 49,634,452 | |
| Investment Long Term - Decrease ( Increase) | (129,477,751) | | 65,645,031 | |
| Investment Adjustment | | | 622,546,965 | |
| Interest Income Received | 189,004,506 | | 118,827,436 | |
| Deferred Expenditure | (89,923,456) | | (71,193,408) | |
| Working Progress | 15,601,006 | (55,931,527) | (1,474,332) | 708,161,786 |
| Net cash Used in investing activities | | (16,957,195) | | (288,323,858) |
| Cash Flows from Financing Activities | | | | |
| Capital Reserve | 0 | | | |
| Capital Grant /Treasury ( Kapruka) | 14,000,000 | | 40,034,421 | |
| Capital Grant /Treasury | | | - | |
| Special Project Ministry grant | | | - | |
| | 14,000,000 | | 40,034,421 | |
| Used in cash activities | | | | |
| Cash handling allowance paid | (1,600,000) | | (1,651,933) | |
| Paid Audit fee | (672,750) | | (570,000) | |
| Gratuity Paid | (32,122,796) | | (13,659,288) | |
| | (34,395,546) | (20,395,546) | (15,881,221) | 24,153,200 |
| | | (37,352,742) | | (264,170,658) |
| Net Cash Generate from financing activities | | | | |
| Net increase/(decrease ) in cash and Cash Equivalents | (37,352,742) | | (264,170,658) | |
| Cash and cash equivalents at beginning of the Year | 254,762,252 | | 518,932,909 | |
| Cash and cash equivalents at end of the Year | 217,409,510 | | 254,762,252 | |

# Coconut Cultivation Board

## STATEMENT OF CHANGES IN NET ASSETS FOR THE YEAR ENDED As at 31 st DECEMBER 2023

Rs.

| | Notes | Accumulated Fund | Accumulated reserve | Translation reserve | Total |
|---|---|---|---|---|---|
| **Balance at 31st December 2020** | | 2,314,178,380 | 241,434,098 | - | **2,555,612,478** |
| Changes in accounting policy | | - | - | | - |
| Adjustment balance | | - | - | | |
| | | **2,314,178,380** | **241,434,098** | - | **2,555,612,478** |
| Surplus on revaluation of properties | | - | - | - | - |
| Deficit on revaluation of investments | | - | - | - | - |
| Currency translation differences | | - | - | - | - |
| | | **2,314,178,380** | **241,434,098** | - | **2,555,612,478** |
| **Net gains and losses not recognized in the statement of financial performance** | | | | | |
| Increase of capital fund | 18 | 20,012,607 | - | - | 20,012,607 |
| Prior year adjustment account | 19 | (788,484) | - | - | (788,484) |
| Surplus/(Deficit) for the period | 19 | 611,133,769 | - | - | 611,133,769 |
| Increase fo capital fund (Kapruka) | 20 | 101,661,834 | - | - | 101,661,834 |
| Increase of credit Guarantee fund (Kapruka) | 21 | 50,233,065 | - | - | 50,233,065 |
| **Balance as at 31st December 2021** | | **3,096,431,171** | **241,434,098** | - | **3,337,865,270** |
| Deficit on revaluation of properties | | - | | - | - |
| Surplus on revaluation of investments | | - | 2,005,170,332 | - | 2,005,170,332 |
| Currency translation differences | | - | - | - | - |
| | | **3,096,431,171** | **2,246,604,430** | - | **5,343,035,601** |
| **Net gains and losses not recognized in the statement of financial performance** | | | | | |
| General fund | | 1,000 | | | 1,000 |
| Increase of capital fund | 18 | (39,399,282) | - | - | (39,399,282) |
| Prior year adjustment account | 19 | 12,221,836 | - | - | 12,221,836 |
| Surplus/(Deficit) for the period | 19 | 389,622,417 | - | - | 389,622,417 |
| Increase fo capital fund (Kapruka) | 20 | 17,939,588 | - | - | 17,939,588 |
| Increase of credit Guarantee fund (Kapruka) | 21 | 23,376,851 | - | - | 23,376,851 |
| **Balance as at 31st December 2022** | | **3,500,193,581** | **2,246,604,430** | - | **5,746,798,011** |
| Deficit on revaluation of properties | | | (265,191,611) | | (265,191,611) |
| Surplus on revaluation of investments | | | | | |
| Currency translation differences | | | | | |
| | | **3,500,193,581** | **1,981,412,819** | - | **5,481,606,400** |
| **Net gains and losses not recognized in the statement of financial performance** | | | | - | |
| General Fund | | 149,767,537 | | - | 149,767,537 |
| Capital Fund | | 34,264,979 | | - | 34,264,979 |
| Prior year adjustment account | | (338,824,959) | | - | (338,824,959) |
| Surplus/(Deficit) for the period | | (62,743,429) | | - | (62,743,429) |
| Increase fo capital fund (Kapruka) | | 9,175,630 | | - | 9,175,630 |
| Increase of credit Guarantee fund (Kapruka) | | 7,773,028 | | - | 7,773,028 |
| Balance as at 31st December 2023 | | **3,299,606,368** | **1,981,412,819** | - | **5,281,019,186** |

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. පීඑල්/එෆ්/සීසීබී/01/2023/07 ඔබේ අංකය / உமது இல. / Your No. දිනය / திகதி / Date 2024 ඔක්තෝබර් 28 දින

COCONUT CULTIVATION BOARD
30 OCT 2024
CHAIRMAN DIVISION
Received Date .........

සභාපති

පොල් වගාකිරීමේ මණ්ඩලය

**පොල් වගා කිරීමේ මණ්ඩලයේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

යථෝක්ත වාර්තාව මේ සමඟ ඉදිරිපත් කර ඇත.

GM/CCB
*For your information & necessary action*

..........................................
Chairman/CCB

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති

පිටපත් : - (1) ලේකම් - මුදල්, ආර්ථික සංවර්ධන, ප්‍රතිපත්ති සම්පාදන, සැලසුම් සහ සංචාරක අමාත්‍යාංශය

(2) ලේකම් - පරිසර, වනජීවී, වන සම්පත්, ජල සම්පාදන, වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය



අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

මගේ අංකය / எனது இல. / My No. } පිඑල්/එෆ්/ඕඕබී/01/2023/07    ඔබේ අංකය / உமது இல. / Your No. }    දිනය / திகதி / Date } 2024 ඔක්තෝබර් 28 දින

සභාපති

පොල් වගා කිරීමේ මණ්ඩලය

**පොල් වගා කිරීමේ මණ්ඩලයේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කල මතය

පොල් වගා කිරීමේ මණ්ඩලයේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, පොල් වගා කිරීමේ මණ්ඩලයේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.




අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව    இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை.    No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.

+94 11 2 88 70 28 - 34    +94 11 2 88 72 23    ag@auditorgeneral.gov.lk    www.naosl.gov.lk

1.2 තත්ත්වාගණනය කල මතය සඳහා පදනම

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 01 හි 48 ඡේදය අනුව අවශ්‍ය කෙරෙන හෝ අවසර දී ඇති විටෙක හැර වත්කම් හා වගකීම් එකිනෙකට හිලව් නොකළ යුතු වුවද රු. 21,193,131 ක කෙටිකාලීන වෙන්කිරීම් ශේෂය තුළ රු.14,485,699 ක හර ශේෂයක්ද ඇතුළත් වී තිබීම නිසා කෙටිකාලීන වෙන් කිරීම් ශේෂය රු.14,485,699 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළදී ආයතන හතරකින් ප්‍රවාහන ගාස්තු හා බෑමේ කුලිද සහිතව රු.51,024,030ක වටිනාකමකට මිලදීගත් පොහොර තොගයක් 2023 දෙසැම්බර් 31 දිනට මහයාය ආදර්ශ පොල් උයනේ ගබඩා කර තිබුණු අතර මූල්‍ය ප්‍රකාශනවල පොහොර තොගයේ පිරිවැය ලෙස රු.50,073,908 ක් පොහොර තොග ගිණුමටද ප්‍රවාහන වියදම් රු.777,942 ක් විවිධ වියදම් ලෙසද බෑමේ ගාස්තු රු.172,180 ආදර්ශ පොල් උයන් වියදම් ලෙසද ගිණුම් ගතකර තිබුණි. මේ හේතුවෙන් අවසන් පොහොර තොගයේ වටිනාකම රු.950,122 ක් අඩුවෙන්ද, විවිධ වියදම් රු.777,942 ක් වැඩියෙන්ද තවාන් වියදම් රු.172,180 ක් වැඩියෙන් ද ගිණුම්වල දක්වා තිබුණි.

(ඇ) 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ආයතන 4 කට අදාළව රු.209,526,817 ක් වූ ප්‍රතිමූල්‍ය ණය ශේෂය මත එම මූල්‍ය ආයතන විසින් ඇප ආවරණ අරමුදල වෙත තැන්පත් කළ යුතු සියයට 0.5 ක වටිනාකම වන රු.1,047,634 ක් වෙනුවෙන් 2023 දෙසැම්බර් 31 දින වන විටත් රු.916,588 ක් බැංකු ගිණුම් තුළ තැන්පත් කර නොතිබුණි. එබැවින් ලැබිය යුතු ඇප ආවරණ හා ඇප ආවරණ අරමුදල රු.916,588 කින් අඩුවෙන් ගිණුම් ගතකර තිබුණි.

(ඈ) ඇප ආවරණ ගිවිසුමෙහි 7.0 ප්‍රකාරව නිරවුල් නොවන ණය ගණයට මාරු වී තිබූ රු.2,403,672 ක ණය ශේෂයක් වෙනුවෙන් 2023 දෙසැම්බර් 31 දින වන විට රු.1,201,701 ක ඇප ආවරණ ගෙවීමක් මණ්ඩලය විසින් සිදුකර තිබුණු අතර ඒ සම්බන්ධයෙන් නීතිමය කටයුත්තක් ක්‍රියාත්මක වෙමින් පැවතියද එය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 08 ප්‍රකාරව අසම්භාව්‍ය වත්කම් ලෙස මූල්‍ය ප්‍රකාශන තුළ හෙළිදරව් කර නොතිබුණි.

(ඉ) ප්‍රධාන කාර්යාලය සඳහා කොටසක් ඉදිකිරීමට අදාළව පැරණි කොන්ත්‍රාත් ගිවිසුම කඩ කිරීම හේතුවෙන් කොන්ත්‍රාත්කරු සමඟ පවතින නීතිමය ගැටළු නිරාකරණයට අදාළව දරන ලද රු.255,500ක වියදම, වියදම් ලෙස හඳුනා නොගෙන නොනිමි වැඩ ලෙස හඳුනා ගෙන තිබුණි.

(ඊ) ප්‍රධාන කාර්යාලයට නව කොටසක් එක් කිරීමට අදාළ කොන්ත්‍රාත්තුව සඳහා ගෙවන ලද රු.1,551,345 ක අත්තිකාරම් මුදල අත්තිකාරම් ලෙස හඳුනා නොගෙන නොනිමි වැඩ ලෙස ගිණුම්ගත වී තිබුණි.

(උ) බත්තුළු ඔය පොල් සංවර්ධන නිලධාරී නිල නිවාස භූමියේ වැට අළුත්වැඩියාව ඇතුළු නිල නිවාසය අළුත්වැඩියාව නිමකර තිබුණද ඒ වෙනුවෙන් මාරවිල ප්‍රාදේශීය කාර්යාලය වෙත ලබා දුන් රු.1,531,659 ක අත්තිකාරම, අත්තිකාරම් ගිණුම බැර කර අළුත්වැඩියා වියදම ලෙස ගිණුම් ගතකර නොතිබුණි.

(ඌ) 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ප්‍රතිමූල්‍ය ණය ශේෂය ලෙස ජංගම වත්කම් තුළ දක්වා තිබුණු රු.560,716,597 ක වටිනාකම මූල්‍ය ආයතන ශේෂ සනාථන අනුව ශේෂය වන අතර 2023 දෙසැම්බර් මාසයට අදාළව මූල්‍ය ආයතන වෙත මණ්ඩලය විසින් ප්‍රතිමූල්‍යනය කර ඇති රු.12,338,000 ක වටිනාකම එම ණය ශේෂය තුළ අන්තර්ගත නොවීම හේතුවෙන් ප්‍රතිමූල්‍ය ණය ශේෂය එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි.

(එ) 2023 දෙසැම්බර් 31 දිනට මහජන බැංකුවට අදාළව බැංකුව විසින් එවූ ශේෂ සනාථන ලිපිය අනුව ප්‍රතිමූල්‍ය ණය ශේෂය රු.82,086,935 ක් වූ අතර මණ්ඩලයේ ලෙජරය අනුව මෙම ශේෂය රු.81,089,716 ක් වුවද මෙම වෙනස පිළිබඳ සොයා බලා නිරවුල් කරගෙන නොතිබුණි.

(ඒ) 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සටහන් තුළ දක්වා ඇති පොල් වගා කිරීමේ මණ්ඩලයට අයත් කුලියාපිටිය, කෑගල්ල, කළුතර, මාතර, මාතලේ ප්‍රාදේශීය කාර්යාල හා නිල නිවාස ඉදිකර ඇති අක්කර 2 රූඩ් 1 පර්චස් 34.4 ක ඉඩම් තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

(ඔ) 2022 වර්ෂයට අදාළ රු.2,971,759 ක රඳවාගැනීම් බදු මුදල සමාලෝචිත වර්ෂයේ වියදම් ලෙස ගිණුම් ගත වීම නිසා එම වටිනාකමින් ඌණතාවය අධිගණනය වී තිබුණි.

(ඕ) 2022 වර්ෂයේ ලැබිය යුතු පොල් පැළ ප්‍රවාහන දීමනාව වූ රු.48,888,000 ක වටිනාකම සමාලෝචිත වර්ෂයේ ආදායම් ලෙස ගිණුම් ගත කර තිබුණි.

(ක) කිසිදු ඉදිකිරීමක් සිදු නොකර 2023 වර්ෂයේදී ප්‍රධාන කාර්යාලයේ ඉදිරිපස කොටසට වානේ ව්‍යුහමය කොටසක් එකතු කිරීම වෙනුවෙන් වූ රු.10,679,161ක ඇස්තමේන්තු මුදල කොන්ත්‍රාත් සඳහා වෙන්කිරීමේ ගිණුම හරකර කොන්ත්‍රාත් ණයගිම් ගිණුමට බැර කර තිබුණි.

(ග) 2023 වර්ෂයේදී මීගමුව බීජ නිෂ්පාදන ඒකකයේ නවීකරණ කටයුතු වෙනුවෙන් වෙන්කර තිබූ රු.3,806,538 ක ඇස්තමේන්තු මුදල කොන්ත්‍රාත් සඳහා වෙන්කිරීම් ගිණුමට හර කර කොන්ත්‍රාත් ණයගිම් ගිණුමට බැරකර තිබුණි.

(ච) 2023 වර්ෂය තුළ ගෙවන ලද 2021 හා 2022 වර්ෂයන්ට අදාළ රු.7,830,263 ක සභාපති වැටුප් හා දීමනා සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගතකර තිබුණි.

(ජ) 2023 වර්ෂයට අදාළව භාණ්ඩාගාරයෙන් ලද ප්‍රාග්ධන ප්‍රදාන රු.34,264,979 ක මුදල සමාලෝචිත වර්ෂයේ ආදායම් ලෙස ගිණුම්ගත නොකර දායකත්ව ප්‍රාග්ධන ප්‍රදාන අරමුදලට බැර කර තිබුණි.

(ඞ) වැවිලි අමාත්‍යාංශයෙන් 2022 වර්ෂයට අදාලව ලැබිය යුතු රු.207,660,000 ක වටිනාකම ලැබිය යුතු ගිණුමකට හර කර තිබූ අතර එම ලැබිය යුතු මුදලෙන් රු.153,430,000 ක් වූ ලැබීම සමාලෝචිත වර්ෂයේදී ද ආදායම් ලෙස ගිණුම් ගත කර තිබුණි. එම ලැබූ වටිනාකම වෙනුවට රු.201,195,000 ක මුදලක් තවාන් වියදම් ගිණුම හරකර ලැබිය යුතු අමාත්‍යාංශ අරමුදල් ගිණුම බැරකර තිබුණි. මේ හේතුවෙන් ලැබිය යුතු අමාත්‍යාංශ අරමුදල් ගිණුම රු.47,765,000 ක් අඩුවෙන්ද එම ප්‍රමාණයෙන් අලාභය වැඩියෙන්ද දක්වා තිබුණි.

(ඬ) කප්රුක ආයෝජන ණය යෝජනා ක්‍රමයට අදාළව සමාලෝචිත වර්ෂය තුළදී මුළු පොළී සහන ගෙවීම් ලෙස රු.16,870,720 ක් ගෙවා තිබුණද සමාලෝචිත වර්ෂයට අදාළ පොළී සහන වියදම රු.427,607 ක් වූයෙන් පොළී සහන වියදම රු.16,443,113 ක් වැඩියෙන් ගිණුම් ගත වී තිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මණ්ඩලයේ 2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු.

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් මණ්ඩලයේ 2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

මෙම විගණක වාර්තාවේ දිනට පෙර මා ලබාගත් අනෙකුත් තොරතුරු මත හා මා විසින් කරන ලද කාර්යයන් මත පදනම්ව, මෙම අනෙකුත් තොරතුරු ප්‍රමාණාත්මක වශයෙන් වැරදි ලෙස දක්වා ඇති බව මම නිගමනය කරන්නේ නම්, එම කරුණ මා විසින් වාර්තා කිරීමට අවශ්‍ය වේ. මේ සම්බන්ධයෙන් මට වාර්තා කිරීමට කිසිවක් නැත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති වියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන

බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසාවන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව්කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

(*) මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1 මාගේ වාර්තාවේ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා මණ්ඩලය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ6 (i) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මෙම වාර්තාවේ මතය සඳහා පදනම කොටසේ 1.2 (අ), (ග) යන ඡේදවල දැක්වෙන නිරීක්ෂණයන් හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට මණ්ඩලය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අනාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණය හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

| නීතිරීති/විධානයට යොමුව | නිරීක්ෂණය (WD) |
|---|---|
| 2020 ජනවාරි 27 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 01/2020 හි 02 වගන්තිය, රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 1/2015 හි 2.3 ඡේදය හා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ 2023 මාර්තු 20 දිනැති අංක PED/P/02/15 (i) temp 3 දරන ලිපිය | පොල් වගා කිරීමේ මණ්ඩලය සඳහා අනුමත කාර්යමණ්ඩලයට ඇතුළත් නොවූ ක්‍රියාකාරී අධ්‍යක්ෂකවරයෙකු සඳහා රු. 59,650 ක මාසික දීමනාවක් සමඟ වෙන්කල වාහනයක් හා මසකට ඉන්ධන ලීටර් 115 ක් ලබා දී තිබූ අතර සමාලෝචිත වර්ෂය තුළ මාසික දීමනාව, ඉන්ධන දීමනාව,අනුයුක්ත කළ රියදුරු අතිකාල හා සංයුක්ත දීමනා ලෙස රු. 1,684,942 ක් ගෙවා තිබුණි. |

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඍ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව

## 2.3 වෙනත් කරුණු

(අ) 2022 වර්ෂයේ සංශෝධිත ක්‍රියාකාරී සැලැස්මට අනුව ආරම්භ කළ පොල් පැළ මිලියන 7.5 ක නිෂ්පාදන ව්‍යාපෘතියක් වෙනුවෙන් මණ්ඩලය විසින් දරන ලද වියදම භාණ්ඩාගාරයෙන් ප්‍රතිපූරණය කරගෙන තිබුණද මෙම ව්‍යාපෘතියෙන් නිෂ්පාදනය කළ පොල් පැළ විකුණා ලද ආදායම වූ රු. 814,263,729 මහා භාණ්ඩාගාරය වෙත නොයවා මණ්ඩලයේ ආදායම ලෙස ගිණුම් ගතකර තිබුණි.

(ආ) මණ්ඩලය ප්‍රධාන තනතුරු 3 ක් වූ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී ( පරිපාලන හා මානව සම්පත් ) නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී ( මූල්‍ය කළමනාකරණ ) හා නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ව්‍යාප්ති හා සංවර්ධන ) යන තනතුරු සමාලෝචිත වර්ෂයේ අවසානයට පුරප්පාඩුව පැවතුණි. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී ( මූල්‍ය කළමනාකරණ ) 2016 වර්ෂයේ සිට පිරවීමට කටයුතු කර නොතිබුණි. අනුමත තනතුරු ( පොල් වගා කිරීමේ මණ්ඩලය සහ ආදර්ශ පොල් උයන් ) 1,070 කින් තනතුරු 356 ක් පුරප්පාඩු වී පැවති අතර අවශ්‍යතාවය අනුව ප්‍රධාන පුරප්පාඩු තනතුරු සම්පූර්ණ කර ගැනීමට හෝ අනුමත තනතුරු සංඛ්‍යාව සංශෝධනය කරගැනීමට කටයුතු කර නොතිබුණි. තවද 2023 වර්ෂයේදී වැඩ බැලීම තනතුරු 77 ක් සඳහා රු.6,783,326 ක මුදලක් ගෙවා තිබුණි.

Acting positions

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති





*To achieve a high living standard to the coconut producer through increasing the coconut production by means of an effective advisory & extension service and development assistant to increase the productivity of coconut land while meeting the domestic consumer demand and export requirement.*


**Coconut Cultivation Board**

**"Kaprukapiyasa"**

**No. 9/428, Denzil Kobbekaduwa Mawatha,**

**Battaramulla**

**011-2861331 / 011-5635623**

**www.coconutsrilanka.lk**